අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)

12 ශ්‍රේණිය

# ý÷ø øÌ´×

## èØ` ´$Ìµè$ûµ÷Á &‘è{×


ආගම් දෙපාර්තමේන්තුව
භාෂා, ආගම්, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# හැඳින්වීම

වර්ෂ 2007 දී 6 සහ 10 යන ශ්‍රේණිවලට හඳුන්වා දෙන ලද නිපුණතා පාදක ඉගෙනුම් ඉගැන්නුම් ප්‍රවේශය ක්‍රමයෙන් වසරින් වසර 7, 8 හා 11 යන ශ්‍රේණිවල විෂය මාලාව සම්බන්ධයෙන් ද යොදා ගන්නා ලද අතර 2009 වසරේදී එය අ.පො.ස (උ/පෙළ) පන්තිවලට අදාළ විෂයමාලාව සම්බන්ධයෙන් ද ව්‍යාප්ත කිරීමට ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සම්පාදකවරුන් සමත් වී තිබේ. එමනිසා 12 හා 13 වන ශ්‍රේණිවල විවිධ විෂය හා අදාළ විෂය නිර්දේශ ද ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ ද සිසුන් තුළ ප්‍රගුණ කළයුතු නිපුණතා ද නිපුණතා මට්ටම් ද පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කොට තිබේ. මෙම තොරතුරු තම විෂය හා අදාළ ඉගෙනුම් - ඉගැන්නුම් අවස්ථා සම්පාදනයේදී ගුරුවරුන්ට මහත්සේ ප්‍රයෝජනවත්වනු ඇත.

අ.පො.ස (උ.පෙළ) විෂය සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සකස් කිරීමේ දී විෂයමාලා සම්පාදකවරුන් විසින් කනිෂ්ඨ ද්විතීයික විෂයමාලාව හා ජ්‍යෙෂ්ඨ ද්විතීයික (10, 11 ශ්‍රේණි) විෂයමාලාව සකසන විට අනුගමනය කොට ඇති ප්‍රවේශයට වඩා වෙනස් වූ ප්‍රවේශයක් අනුගමනය කොට ඇති බව සඳහන් කරනු කැමැත්තෙමි. 6, 7, 8, 9, 10 හා 11 යන ශ්‍රේණිවල දී විෂය කරුණු ඉගැන්වීමේ දී අනුගමනය කළයුතු ඉගෙනුම් හා ඉගැන්නුම් ප්‍රවේශ සම්බන්ධයෙන් ගුරුවරුන් අභිමත ආකෘතියකට යොමු කරන ලද මුත් අ.පො.ස (උ.පෙළ) විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සම්පාදනයේ දී ගුරුවරුන්ට තම අභිමතය පරිදි ක්‍රියාකිරීමටත් ප්‍රශස්ත නිදහසක් භුක්ති විඳීමටත් ඉඩ ප්‍රස්ථාව සලසා තිබේ. මෙම තලයේ දී ගුරුවරුන්ගෙන් අපේක්ෂා කරනුයේ ඒ ඒ විෂය ඒකකයට හෝ පාඩමට නියමිත නිපුණතා සහ නිපුණතා මට්ටම් වර්ධනය කිරීම පිණිස යෝජිත ඉගැන්නුම් ක්‍රමවලින් තමන් අභිමත ඉගැන්නුම් ක්‍රමයක් යොදා ගැනීම ය. තමන් යොදා ගන්නා ඉගැන්නුම් ප්‍රවේශය සතුටුදායක හා කාර්යක්ෂම ලෙස යොදා ගනිමින් අපේක්ෂිත නිපුණතා හා නිපුණතා මට්ටම් ළඟා කර ගැනීම ගුරුවරුන් විසින් නොපිරිහෙළා ඉටු කරනු ලැබිය යුතු ය. මෙම නිදහස ගුරුවරුන්ට ලබා දීමට තීරණය කරන ලද්දේ අ.පො.ස (උ.පෙළ) විභාගයේ ඇති වැදගත්කම සහ එම විභාගය කෙරෙහි අධ්‍යාපන පද්ධතියේ සියලු ම අය දක්වන සංවේදී බව සැලකිල්ලට ගෙන බව සටහන් කරනු කැමැත්තෙමි.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ගුරුවරුන් හට මාහැඟි අත්පොතක් වේවායි ප්‍රාර්ථනය කරමි. අපේ දරුවන්ගේ නැණැස පාදන්නට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇති තොරතුරු ක්‍රමවේද සහ උපදෙස් අපගේ ගුරුවරුන් හට නිසි මගපෙන්වීමක් කරනු ඇතැයි අපේක්ෂා කරමි.

මහාචාර්ය ලාල් පෙරේරා

අධ්‍යක්ෂ ජනරාල්

# සංදේශය

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 2009 වර්ෂයේ සිට 12 වන ශ්‍රේණිය සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සඳහා ගුරු භවතුන්ට ප්‍රයෝජනවත් වේ.

මෙම පොත සම්පාදනය කිරීමට පාදක කරගත් විෂය නිර්දේශය මෙතෙක් පැවති විෂය නිර්දේශවලට වඩා වෙනස් වූවකි. එම වෙනස හඳුනා ගැනීමට යොමුවන ඔබට එය නිපුණතා පාදක විෂය නිර්දේශයක් බව දැකිය හැකි ය. මෙහි දැක්වෙන නිපුණතාවක් එම ශ්‍රේණිය තුළදී ම සාක්ෂාත් කර ගත යුතු යැයි අපේක්ෂා නොකෙරේ. ඇතැම්විට ඒ සඳහා බොහෝ කලක් ගතවිය හැකි ය. එහෙත් නිපුණතා මට්ටම් හා එක් එක් නිපුණතා මට්ටම් යටතේ දැක්වෙන ඉගෙනුම් ඵල එම ශ්‍රේණිය තුළදී ම අත්පත් කර ගත යුතු වේ. එබැවින් ඔබට ශ්‍රේණියට අදාළ පාඩම් සැළසුම් කර ගැනීමේ දී එම නිපුණතා මට්ටම් හා ඉගෙනුම්ඵල බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මෙම ඉගෙනුම්ඵල ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී එක් එක් අරමුණු සකසා ගැනීමට මෙන් ම පන්ති කාමරයේ දී සිදු කෙරෙන ඇගයීම් උපකරණ සකස් කර ගැනීමේ දී නිර්ණායක ලෙස යොදා ගැනීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ. මෙම විෂය හැදෑරීමේ දී පරිශීලනය කළ යුතු අතිරේක පොත් පත් මෙන් ම වෙබ් අඩවි පිළිබඳ සිසුන් දැනුවත් කිරීමට ද මෙම ගුරු මාර්ගෝපදේශය ඔබට ප්‍රයෝජනවත් වේ.

මෙහි යෝජිත ක්‍රියාකාරකම් ඔබ නිර්මාණශීලී ගුරුවරයෙකු වශයෙන් ක්‍රියා කිරීමේ අපේක්ෂා සහිතව ආදර්ශවත් ලෙස ඉදිරිපත් කළ ඒවා වශයෙන් සලකන්න. ගුරු කේන්ද්‍රීය පන්ති කාමර ක්‍රියාවලිය වෙනස් කර ශිෂ්‍ය කේන්ද්‍රීය බවක් ඇති කිරීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ. එබැවින් සිසුන් විවිධ පොත්පත් පරිශීලනයට අන්තර්ජාල භාවිතය වැනි ගවේෂණයට යොමු කෙරෙන ඉගෙනුම් අවස්ථා හැකි හැමවිට ම උදා කළ යුතු වේ. ඉගැන්වීමේ දී සම්ප්‍රදායික ලෙස සටහන් ඉදිරිපත් කිරීම වෙනුවට ආකර්ෂණීය ලෙස නව දැනුම මූලධර්ම ආදිය ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා තාක්ෂණය හැකිතාක් දුරට යොදාගත් සන්නිවේදන උපක්‍රම භාවිත කිරීම නව පන්තිකාමරය තුළ දී උනන්දු විය යුතු වේ. ඒ සඳහා නව තාක්ෂණික උපකරණ හැකිතාක් දුරට භාවිත කිරීමට නිර්මාණශීලීවීම අවශ්‍ය වේ.

12 වන ශ්‍රේණියේ දී මෙම විෂය ඉගෙනීම අරඹන ඔබගේ සිසුන්ට විෂය නිර්දේශ මනාව පැහැදිලි කර දෙන්න. වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ඔබගේ ඉගැන්වීමේ සැළැස්ම හඳුන්වා දෙන්නේ නම් එය සිසුන් තුළ පෙළඹවීමක් වනු ඇත. මුළු විෂය නිර්දේශය ආවරණය කර ගැනීමට පාසල වෙත සිසුන් ආකර්ෂණය වේ. මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණ රටට දැනෙන පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ වෙනසක් ඇති කරනු සඳහා අදාළ විෂය නිර්දේශය මෙන් ම මෙහි යෝජිත ක්‍රියාවලි ඇසුරෙන් ඔබගේ නිර්මාණශීලී හැකියා පුබුදුවා ගන්නා මෙන් ඉල්ලමි.

මෙම මාර්ගෝපදේශ සැකසීමේ දී දායක වූ විද්වත් සැමට, ගුරුභවතුන්ට සහ ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන්ට මගේ ස්තූතිය හිමි වේ. මේ කාර්යය සඳහා මගපෙන්වූ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ලාල් පෙරේරා මැතිඳුන් මෙන් මුද්‍රණ කටයුතු සිදුකර පාසල්වලට ලබාදීමේ වගකීම භාරගෙන කටයුතු කළ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් ඇතුළු කාර්යය මණ්ඩලයට මගේ විශේෂ ස්තූතිය පුද කරමි. මෙහි ඇතුලත් කරුණු පිළිබඳ ව සංවර්ධනාත්මක යෝජනා ඇතොත් මා වෙත ලබාදෙන්නේනම් කෘතඥ වෙමි.

විමල් සියඹලාගොඩ
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය.

# උපදේශක හා ලේඛක මණ්ඩලය

**මෙහෙයවීම** - මහාචාර්ය ලාල් පෙරේරා මහතා
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

**උපදේශන හා**
**මග පෙන්වීම** - විමල් සියඹලාගොඩ මහතා
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

**අධීක්ෂණය** - ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
අධ්‍යක්ෂ (ආගම්)
ජාතික අධ්‍යාපන ආයතනය

**ලේඛක මණ්ඩලය** -පූජ්‍ය ගන්තුනේ අස්සජි හිමි
(බී.ඒ. ගෞරව, එම්.ඒ., ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ හිටපු කථිකාචාර්ය)
මහාචාර්ය පූජ්‍ය දේවාලේගම මේධානන්ද හිමි
(බී.ඒ.ගෞරව, එම්.ඒ., පී.එච්.ඩී., කැළණිය විශ්ව විද්‍යාලය)
පූජ්‍ය ආචාර්ය තැරැලේ ධම්මරතන හිමි
(බී.ඒ. ගෞරව, එම්.ඒ., පී.එච්.ඩී., කැලණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
පූජ්‍ය උඩුගම සුදස්සි හිමි (ව්‍යාපෘති නිලධාරි)
(ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා, අධ්‍යාපනවේදී)
පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි (සහකාර ව්‍යාපෘති නිලධාරි)
(බී.ඒ.ගෞරව, එම්.ඒ., රාජකීය පණ්ඩිත, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා)
ආචාර්ය උදිත ගරුසිංහ මහතා (බී.ඒ.ගෞරව, එම්.ඒ., පී.එච්.ඩී., ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
කැලණිය විශ්ව විද්‍යාලය)
ගුණසේන මහතන්ත්‍රිගේ (බී.ඒ. ගෞරව, එම්.ඒ.,අධ්‍යාපන ඩිප්ලෝමා, අධ්‍යාපන
අමාත්‍යාංශයේ හිටපු නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ)
එස්.පී. විතාන මයා (ව්‍යාපෘති නිලධාරි)
(බී.ඒ., එම්.ඒ.,පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා )

**සංස්කරණය** : ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
(බී.ඒ.ගෞරව , පී.එච්.ඩී., අධ්‍යාපන ඩිප්ලෝමා, අධ්‍යක්ෂ ආගම්, ජාතික අධ්‍යාපන
ආයතනය)

**පරිගණක වදන් සැකසුම** : පී. නිල්මිණි ප්‍රනාන්දු මිය

**විවිධ සහාය** : එස්. සී. ප්‍රියදර්ශනී මිය
අයි. ජී. බෝජිත මයා

# පටුන


| | |
|---|---|
| හැඳින්වීම | iii |
| සංඥාපනය | iv |
| අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන කොමසාරිස්තුමාගේ පණිවුඩය | v |
| උපදේශක හා ලේඛක මණ්ඩලය | vi |
| නිපුණතාව 1.0 | 1 - 7 |
| නිපුණතාව 2.0 | 08 - 13 |
| නිපුණතාව 3.0 | 14 - 17 |
| නිපුණතාව 4.0 | 18 - 22 |
| නිපුණතාව 5.0 | 23 - 25 |
| පාසල පදනම් කරගත් තක්සේරුකරණය හැඳින්වීම සහ ඉගෙනුම් උපකරණ | 26 - 36 |

**නිපුණතාව 1.0** : ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදායයේ එන සිද්ධාර්ථ ගෞතම සම්බුද්ධ චරිතය විමර්ශනාත්මකව හදාරමින් ආදර්ශ ලබා ගනියි.

**නිපුණතා මට්ටම 1.1** : බුද්ධ චරිතයෙහි අසම - සම බව හඳුනාගෙන ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 35

**ඉගෙනුම් ඵල** : බුදුරජාණන් වහන්සේ ලෝකයේ පහළ වූ අසම සම මනුෂ්‍යයා බව වටහා ගනිමින් සැදැහැවත් වෙයි.
සුවිශේෂී ශිෂ්‍යයකකු වීම සඳහා බුදු සිරිතෙන් ආදර්ශ ගනියි.

**විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්** :

1.1.1 සමකාලීන මහණ බමුණන් අතර බුදුරජාණන් වහන්සේගේ විශේෂත්වය

- බුදුරදුන්ගේ අසම සම බව දැකීමට සමකාලීන අන්‍ය ශාස්තෘ චරිත හැඳින ගැනීම ප්‍රයෝජනවත් බව.
- බුද්ධකාලීන සමණ බ්‍රාහ්මණයන් විවිධ දෘෂ්ටිවාදවල එල්බ ගෙන සිටි නමුදු බුදුරදුන් කිසිදු දෘෂ්ටිවාදයක එල්බ නොගත් බව.
- බුද්ධකාලීන සමණ බ්‍රාහ්මණයන් සිය මතයම සත්‍ය යැයි තර්ක කළ නමුදු බුදුරදුන් මධ්‍යස්ථව කරුණු දැක්වූ බව.
- බුද්ධකාලීන බ්‍රාහ්මණයන් දෙවියන්ගේ නියෝජිතයන් ලෙස පෙනී සිටි නමුදු බුදුරදුන් විශිෂ්ඨ ගුණ නුවණින් යුත් උතුම් මනුෂ්‍යයෙකු වූ බව.
- බුද්ධකාලීන සමණ බ්‍රාහ්මණයන් මෙන් නොව බුදුරදුන් අන් අයටද සවන්දුන් බව.

1.1.2 බුදුරජාණන් වහන්සේගේ ආශ්චර්යවත් මනුෂ්‍යත්වය

- බුදුරජාණන් වහන්සේ මනුෂ්‍යයකු වුවද උන්වහන්සේ සාමාන්‍ය මනුෂ්‍යයකු නොව ලෝකයේ කලාතුරකින් උපදින අතිශය දුර්ලභ ශ්‍රේෂ්ඨ පුරුෂයකු බව.
- බුද්ධ යන අන්වර්ථ නාමයෙන් හැඳින්වුණු තථාගතයන් වහන්සේ දේව, ගන්ධබ්බ, යක්ඛ, මනුස්ස ආදී සීමාවන් ඉක්මවා ගිය ලෝකෝත්තර උතුමකු බව.
- සාමාන්‍ය මනුෂ්‍යයන් ඉක්මවා ගිය උතුම් චරිතයක් ඇති නිසාත් ආශ්චර්යවත් සිද්ධි චරිතය සමඟ සම්බන්ධ නිසාත් බුදුරජාණන් වහන්සේ අච්ඡරිය මනුස්ස නාමයෙන් හැඳින්වෙන බව.

1.1.3 බුදුරජාණන් වහන්සේගේ රූපකායෙහි විශේෂතා

- කිසිදු ඌනතාවක් නැති ශරීරාවයව වලින් යුක්ත නිසා බුද්ධ ශරීරය ආකර්ශනීය වූ බව.
- මහා පුරුෂයන්ට පිහිටන සුවිශේෂ ශරීර ලක්ෂණ තිස් දෙකක් හා එම ලක්ෂණ වඩාත් ඔපවත් කැරෙන අනු ලක්ෂණ අසූවක් බුද්ධ ශරීරයෙහි පිහිටි බව.

- බුදු සිරුරෙහි සුවිශේෂ ලක්ෂණ පිහිටා තිබෙන්නේ සසර දිගු කලක් පාරමී ධර්ම සම්පූර්ණ කිරීමේ ආනිසංශ වශයෙනැයි සඳහන්වන බව.

### 1.1.4 බුදුරජාණන් වහන්සේගේ විශිෂ්ට දේශනා විලාසය හා ඉගැන්වීම් ක්‍රම

- බුදුරජාණන් වහන්සේ තිලෝගුරු බව.
- බුදු බණ අසා තෙරුවන් සරණ ගිය අයගේ උදාන වාක්‍යයන්ගෙන් සහ බුදුරදුන් පිළිබඳ කීර්තිරාවය පැතිරගිය ආකාරය දැක්වෙන ප්‍රකාශන වලින් උන්වහන්සේගේ දේශනා විලාසයේ විශිෂ්ටත්වය අනාවරණය වන බව.
- ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ බුද්ධි මට්ටම, මානසික ස්වභාවය, දාෂ්ටිමය පදනම ආදිය සැලකිල්ලට ගනිමින් උපමා භාවිතය ආදී විවිධ දේශනා පර්යාය අනුගමනය කරමින් උපාය කුසලතාවෙන් යුතුව බුදුරදුන් දහම් දෙසූ ආකාරය ප්‍රකටවන අවස්ථා ඇති බව.
- වර්තමාන අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි හඳුන්වා දෙනු ලබන බොහෝ ඉගැන්වීම් ක්‍රම සමඟ සැසඳිය හැකි ඒවා ඉක්මවා ගිය අගයෙන් යුත් ඉගැන්වීම් ක්‍රම බුදුරදුන් භාවිතකර ඇති බව.
- දේශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, සංවාද ක්‍රමය, ප්‍රශ්නෝත්තර ක්‍රමය, කතන්දර ක්‍රමය, පියවර ක්‍රමය, පැවරුම් ක්‍රමය, අනාවරණ ක්‍රමය, සූක්ෂම ඉගැන්වීම, ප්‍රතිකාර්ය ඉගැන්වීම ඉගෙනුම් සම්පත් භාවිතය බුදුරජාණන් වහන්සේ භාවිතා කර ඇති බව.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**: පියවර 1

සියපින් සිරින් සරු - දෙතිස් ලකුණින් විසිතුරු
කෙලෙසුන් කෙරෙන් දුරු - වඳිම් මුනි උතුමන් තිලෝගුරු
කවිය සිසුන්ට ඉදිරිපත් කර අදහස් විමසමින් පාඩමට පිවිසෙන්න.

බුදු රජාණන් වහන්සේගේ සුවිශේෂී මානුෂික ගුණාංග පිළිබඳ කරුණු ගවේෂණයට ශිෂ්‍යයන් යොදවන්න.

එහිදී බුදුරජාණන් වහන්සේගේ රූපකාය හා ආශ්චර්යවත් මනුෂ්‍යත්වය කෙරේ වැඩි අවධානයක් යොමු කරවන්න.

පියවර 2

එක්රැස් කළ කරුණු සාකච්ඡා කරන්නට සිසුන්ට අවස්ථාව දෙන්න. එම ගුණාංග පුවරුවක සටහන් කරන්න. ගුරුභවතාද ඊට සහාය දක්වන්න.

පියවර 3

බුදුගුණ කාව්‍ය භාෂාවෙන් ලියන ලද සාහිත්‍ය කෘති ඇති බව පවසා සිසුන්ට ඉන් පොත් කිහිපයක් නිදසුන් කොට දක්වන්න.

පැවරුම

බුදුසිරුතේ සුවිශේෂී ලක්ෂණ කියැවෙන පද්‍ය අටක් නිර්මාණය කරන්න.

**මූලාශ්‍රය** : සාමඤ්ඤඵල සූත්‍රය (දීඝ නිකාය)
නානාතිත්ථිය සාවක සූත්‍රය (සංයුක්ත නිකාය)
මක්ඛලි සූත්‍රය (අංගුත්තර නිකාය)
ලක්ඛණ සූත්‍රය (දීඝ නිකාය)

චුල්ලහත්ථි පදෝපම සූත්‍රය (මජ්ඣිම නිකාය)
අභයරාජ කුමාර සූත්‍රය (මජ්ඣිම නිකාය)
අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය (මජ්ඣිම නිකාය)
අලගද්දූපම සූත්‍රය (මජ්ඣිම නිකාය)
සිංහල දික්සගිය - බලන්ගොඩ ආනන්ද මෛත්‍රිය මාහිමි
මහා පුරුෂ සංකල්පය - බෙල්ලන්විල විමලරතන හිමි
බෞද්ධ ඉගැන්වීම් ක්‍රම - (මොඩියුලය) සෙනෙවිරත්න මහ ලේකම
ජාතික අධ්‍යාපන ආයතනය

**නිපුණතා මට්ටම 1.2** : රහතන් වහන්සේට වඩා බුදුරජාණන් වහන්සේ තුළ ඇති විශේෂතා හඳුනා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 25

**ඉගෙනුම්ඵල** : සමාජ හිතකාමී කාරුණික පුද්ගලයෙකු වෙයි.
බුද්ධිමත් භාවයෙහි අගය වටහාගෙන ක්‍රියා කරයි.
කරුණාව හා ප්‍රඥාව වර්ධනය කර ගැනීමෙන් සමාජයෙ හි යහපත් සාමාජිකයකු සේ කටයුතු කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

1.2.1 නව අරහාදී බුදුගුණ සවිස්තරව

- බුදුරදුන්ගේ කීර්ති රාවය පිළිබඳ සඳහන් කැරෙන සෑම අවස්ථාවකදීම පාහේ නව අරහාදී බුදුගුණ ගැන කියැවෙන බව.
- “ඉතිපිසෝ” පාඨයෙහි දැක්වෙන බුදු ගුණ සංඛ්‍යාමය වශයෙන් ගොනු කිරීමේදී සුළු සුළු වෙනස්කම් දක්නට ලැබෙන බව.
- එක් එක් ගුණ නාමයෙහි අන්වර්ථ භාවය පැහැදිලි කැරෙන සාම්ප්‍රදායික විවරණ ඇති බව.

1.2.2 මහා කරුණාව හා මහා ප්‍රඥාව

- මහා කරුණාව හා මහා ප්‍රඥාව බුදුරදුන්ගේ විශිෂ්ටත්වය ප්‍රකට කැරෙන ප්‍රධාන ලක්ෂණ දෙක බව.
- ඇඳක තබාගෙන ඔසවාගෙන යන තරමට බුද්ධ ශරීරය දුර්වල වුවද උන්වහන්සේගේ ප්‍රඥා ශක්තියෙහි වෙනසක් සිදුනොවන්නේ ය යි බුද්ධ දේශනාවේ ම සඳහන්වන බව.
- ඕනෑම කෙනෙකුගෙන් ඉදිරිපත්වන ඕනෑම ප්‍රශ්නයකට බුදුරජාණන් වහන්සේ විසිතුරු ලෙස පිළිතුරු සැපයුයේ මහා ප්‍රඥාව පාදක කොට ගෙන බව.
- සබ්බඤ්ඤුත ඤාණ, අනාවරණ ඤාණ ආදියෙන් ද බුදුරදුන්ගේ මහා ප්‍රඥාව ප්‍රකටවන බව.
- බුදුරජාණන් වහන්සේ තමන් අවබෝධ කළ ධර්මය විවිධ ප්‍රදේශවල චාරිකා කරමින් මහා කරුණාවෙන් දේශනා කළ බව.
- සත්වයාගේ මෙලොව අසරණභාවයට පිහිටවීම තුළින් කරුණා ගුණයද සත්වයාගේ සංසාරික අසරණ භාවය සලකා දුකින් එතෙරවීමේ මහ පෙන්වාදීමට ඉදිරිපත් වීම තුළින් මහා කරුණා ගුණය ද ප්‍රකට වන බව.

1.2.3 රහතන් වහන්සේට නොමැති බුදුරජාණන් වහන්සේට පමණක් ඇති ඤාණ

- බුදුරජාණන් වහන්සේ හා රහතන් වහන්සේ අතර සමානතා ඇති බව.

- දසබල චතුර් වෛශාරද්‍ය, අසාධාරණ ඥාණ වැනි සුවිශේෂ ඥාණ හා ශක්ති බුදුරදුන්ට පමණත් ඇති බව.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**:පියවර 1

තුන්තරා බෝධිය නම් කුමක්දැයි සිසුන්ගෙන් විමසන්න. බුදුරජාණන් වහන්සේ හා රහතන් වහන්සේලා කෙලෙස් නැසූ උතුමන් බව පැහැදිලි කරන්න. බුදුරජාණන් වහන්සේ සම්බන්ධ පැහැදිලි ගුණ නවයක් ඇති බවත් ඒවා නව අරහාදි බුදුගුණ බවත් පහදන්න. ඒවාට අමතරව මහා ප්‍රඥාව හා මහා කරුණාව බුදුරදුන්ගේ විශිෂ්ටත්වය ප්‍රකට කරන බව සිසුන්ට පැහැදිලි කරන්න.

පියවර 2

සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා එක් කණ්ඩායමකට බුදුරජාණන් වහන්සේගේ සුවිශේෂී ලක්ෂණ ගවේෂණයටත් අනෙක් කණ්ඩායම රහතන් වහන්සේගේ සුවිශේෂී ලක්ෂණ ගවේෂණයටත් යොමු කරන්න.

පියවර 3

කණ්ඩායම් දෙක ගවේෂණයෙන් සොයා ගත් කරුණු අනාවරණයට අවස්ථාව දෙන්න. ඌණ පුරණයට අවස්ථාව අදාළ කණ්ඩායම්වලට ලබා දෙන්න. කණ්ඩායම් දෙකෙහි ම සංවර්ධනාත්මක අදහස් ලබා ගන්න. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් සපයමින් කරුණු තහවුරුවනසේ සමාලෝචනයක යෙදෙන්න.

පැවරුම

බුදුරජාණන් වහන්සේගේ හා රහතන් වහන්සේගේ සුවිශේෂතා පිළිබඳව වගු දෙකක් සකසා පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.

**මූලාශ්‍රය** :

සෝණදණ්ඩ සූත්‍රය (දීඝ නිකාය)
අනුස්සති නිද්දේසය (විසුද්ධි මාර්ගය)
බ්‍රහ්මජාල සූත්‍රය (දීඝ නිකාය)
මහා සකුළුදායි සූත්‍රය (මජ්ඣිම නිකාය)
මහා සීහනාද සූත්‍රය (මජ්ඣිම නිකාය)
සම්පසාදනීය සූත්‍රය (දීඝ නිකාය)
ධාතු විභංග සූත්‍රය (මජ්ඣිම නිකාය)
බුද්ධ වග්ගය - ධම්මපදය (ඛුද්දක නිකාය)
පටිසම්භිදා මග්ගය (ඛුද්දක නිකාය)
පූජාවලිය
බුදුගුණාලංකාරය
සූවිසි මහ ගුණය - රේරුකානේ චන්දවිමල හිමි
බුද්ධ චරිතය - බලංගොඩ ආනන්ද මෛත්‍රිය මාහිමි

**නිපුණතා මට්ටම 1.3** : පෞරුෂ වර්ධනය සඳහා සම්බුද්ධ චරිතාදර්ශ ලබාගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 30

**ඉගෙනුම් ඵල** : අටලෝ දහමින් අකම්පිතව ජීවිත ප්‍රශ්නවලට මුහුණ දෙයි. සංවර්ධිත පෞරුෂයකින් යුතු අයෙක් වෙයි. අන්‍යයන්ට සවන් දෙන ගරු කරන පුද්ගලයෙකු වෙයි. සහජීවනයෙන් කටයුතු කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

1.3.1 බුදුරජාණන් වහන්සේගේ ගවේෂණශීලීත්වය හා විමර්ශනශීලීත්වය

- සිද්ධාර්ථ කුමාර අවධියේ සිට ම ගවේෂණශීලීත්වය හා විමර්ශනශීලීත්වය විවිධ අවස්ථාවලින් ප්‍රකට වන බව.
- බෝසතුන් අභිනිෂ්ක්‍රමණයට පෙළඹුනේ තමන්ට දක්නට ලැබුණු දේ ගැන විමර්ශනශීලීවීම නිසා බව.
- අභිනිෂ්ක්‍රමණයෙන් පසුව "කිං කුසල ගවේසී " වූ බව.
- ආලාරකාලාම, උද්දකරාම යන තවුසන් ඇසුරේ ක්‍රියා කළ ආකාරයෙන් ද බෝසතුන්ගේ විමර්ශනශීලීත්වය ප්‍රකට වන බව.
- කෙනෙකු ඇසුරු කිරීමේදී මෙන් ම යම් මතවාදයක් පිළිගැනීමේදී හෝ ප්‍රතික්ෂේප කිරීමේ දී ද විමර්ශනශීලීවීමේ අවශ්‍යතාව බුදුරදුන් පෙන්වා දුන් බව.
- තමන් පිළිබඳ ගවේෂණය වඩා වැදගත් යැයි බුදුරදුන් විසින් දේශනා කරන ලද බව.

1.3.2 සමානාත්මතාව, සහජීවනය හා අන්‍යයන්ට සවන්දීම

- අසාධාරණ ලෙස සමාජය බෙදා දැක්වීම ප්‍රතික්ෂේප කළ බුදුරජාණන් වහන්සේ සියලු දෙනා දෙස ම සමානාත්මතාවයෙන් බලා කටයුතු කළ බව.
- බුදුරජාණන් වහන්සේ විවිධ පිරිස් ඇසුරු කළ නමුදු ගැටුම් මතවාද වලින් තොරව සහජීවනයෙන් ක්‍රියා කළ බව.
- බුදුරජාණන් වහන්සේ අන්‍ය තීර්ථක ආරාමවලට වැඩම කර ඔවුන් සමඟ සාකච්ඡා කරමින් සුහදව ජීවත් වූ බව.
- විනය ශික්ෂා පැනවීම් ඒවා සංශෝධනය කිරීම් ආදියේ දී අන්‍යයන්ට සවන් දීමේ ලක්ෂණය ප්‍රකටවන බව.

1.3.3 යථාවාදී තථාකාර සහ යථාකාර තථාවාදී ගුණය

- විජ්ජාචරණ සම්පන්නතාව යන්නෙන් ගැනෙන්නේ උසස් දැනීම හා උතුම් හැසිරීම යන දෙකම එක්තැන්වූ ගුණය වන බව.

- පවසන දේ ක්‍රියාත්මක කරන, කරන දේම පවසන ලක්ෂණය බුද්ධ චරිතයෙහි විද්‍යමාන බව.
- ආධ්‍යාත්මික සංවර්ධනයටත් සමාජගත ජීවිතයටත් ඉහතකී චරිත ලක්ෂණ දෙක අත්‍යවශ්‍ය බව.

1.3.4 තාදි ගුණය හා පද්මාකාර ජීවිතය

- අටලෝ දහමින් කම්පා නොවන ස්වභාවය තාදි ගුණය නම් වන බව.
- වැරදි බහුල සමාජයක නිවැරදි ජීවිතයක් ගත කිරීම පද්මාකාර ජීවිතය නමින් හැඳින්වෙන බව.
- සංවර්ධිත පෞරුෂයක ඉහත ලක්ෂණ දෙක ම තිබෙන බව.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

පියවර 1 කරන දේ කියන - කියන දේ කරන අය අප අතර සිටීදැයි සිසුන්ගෙන් විමසන්න. එසේ වූ අය වෙත්නම් ඒ අයගේ ක්‍රියා කලාප කෙබඳුදැයි විමසන්න.

පියවර 2 ශිෂ්‍ය පිරිස කණ්ඩායම් දෙකකට බෙදන්න. බුදුරජාණන් වහන්සේගේ ගවේෂණශීලීත්වය පිළිබඳව කරුණු සොයන්නට එක් කණ්ඩායමකටත්, බුදුරජාණන් වහන්සේගේ විමර්ශනශීලීත්වය පිළිබඳව කරුණු විමසන්නට අනෙක් කණ්ඩායමටත් පවරන්න.
නිර්දිෂ්ට මූලාශ්‍ර ග්‍රන්ථ භාජනයට භාවිතයට යොමු කරන්න.
ශිෂ්‍ය පෞරුෂ වර්ධනය කෙරෙහි බුදුසිරිතේ දැක්වෙන එම ගුණාංග යොදාගත හැකි ආකාරය ඉදිරිපත් කිරීමට සිසුන් මෙහෙයවන්න.

පියවර 3 සිසුන් එක්රැස් කරන කරුණු පන්තිය ඉදිරියේ අනාවරණය කරන්න. කණ්ඩායම් දෙක අතර අදහස් - යෝජනා සංවර්ධනාත්මකව ඉදිරිපත් කරමින් සමාලෝචනයක යෙදෙන්න.

පැවරුම බුදුරජාණන් වහන්සේගේ ගවේෂණශීලීත්වය පිළිබඳව හා බුදුරජාණන් වහන්සේගේ විමර්ශනශීලීත්වය පිළිබඳව හදාරා එයින් ශිෂ්‍ය ජීවිතයේ වර්ධනය කරගත හැකි ලක්ෂණ සන්සන්දනය කරමින් පුවත්පත් ලිපියක් ලියන්න.

**මූලාශ්‍රය :**

| | |
|---|---|
| අරියපරියේසන සූත්‍රය | (මජ්ඣිම නිකාය) |
| කාලාම සූත්‍රය | (අංගුත්තර නිකාය) |
| උපාලි සූත්‍රය | (මජ්ඣිම නිකාය) |
| වීමංසක සූත්‍රය | (මජ්ඣිම නිකාය) |
| වාසෙට්ඨ සූත්‍රය | (මජ්ඣිම නිකාය) |
| පොට්ඨපාද සූත්‍රය | (දීඝ නිකාය) |
| වස්සූපනායිකබන්ධකය | (මහාවග්ගපාලි) |
| අක්කෝසක භාරද්වාජ වත්ථු (ධම්ම පදට්ඨ කථා) | |
| ද්‍රෝණ සූත්‍රය | (අංගුත්තර නිකාය) |
| සුඛවග්ග 1, 2,3 | (ධම්මපදය පණ්ඩිත වග්ග 6) |

**නිපුණතාව 2.0** : බුද්ධ භාෂිත ශ්‍රී සද්ධර්මයෙහි සුවිශේෂතා අගය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : බුද්ධ ධර්මයෙහි සුවිශේෂ ගුණ දැක සැදැහැවත් බව ඇති කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 10

**ඉගෙනුම් ඵල** : දහමෙහි ගුණ දැන එහි ඇළුම් කරයි.
විමසීමෙන් යුතුව කටයුතු කරන්නට පෙළඹෙයි.
කරුණු අවබෝධය තම තමන් විසින්ම කළ යුතු බව පිළිගනියි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**
: 2.1.1 ස්වාක්ඛාතාදී සවැදෑරුම් දහම් ගුණවලින් හෙළිවන සුවිශේෂතා

- මුල මැද අග යහපත් සේ දෙසූ දහමක් බව.
- තම ජීවිත කාලය තුළ දී තමාටම දැකගත හැකි දහමක් බව.
- නිවැරදිව පිළිපැදීමෙන් කල් නොයවා ඕනෑම කාලයකදී ප්‍රතිඵල අත්දැකිය හැකි දහමක් බව.
- අන්ධ භක්තියෙන් පිළිනොගෙන පරීක්ෂා කර බලා පිළිගැනීමට පොළඹවන දහමක් බව.
- තමාගේ සිතටම පමුණුවාගෙන අත්දැකිය යුතු දහමක් බව.
- තම තමා විසින් වෙන වෙනම අවබෝධ කරගත යුතු නුවණැතියන්ටම විෂය වූ දහමක් බව.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**: පියවර 1

"ස්වාක්ඛාතෝ යනාදී " පාඨයේ අදහස ඇති කවියක් නිර්මාණය කර ශිෂ්‍යයන් වෙත ලබාදෙන්න. එහි සඳහන් වන කරුණු පිළිබඳව විමසන්න.
දහම් ගුණ හයක් ඇති බවත් ඒවා හඳුනාගෙන ධර්මයට ගරු කරමින් ධර්මගරුකවීම අපගේ වගකීම බවත්, ඒ අනුව ජීවිතයේ නිවැරදි ප්‍රතිපදාවකට යොමුවිය හැකි බවත් පැහැදිලි කරන්න.

පියවර 2

සිසුන් කණ්ඩායම් තුනකට බෙදා පිළිවෙලින් දහම් ගුණ දෙක බැගින් නම් කොට එහි අර්ථ ඉදිරිපත් කරන්නටත්, එමගින් ඉදිරිපත් කරන ධර්ම කරුණු ජීවිතයේ ප්‍රගතිය සඳහා යොදාගත හැකි ආකාරයත් පැහැදිලි වනසේ කරුණු ගවේෂණයේ යොදවන්න.
මූලාශ්‍ර භාවිතයට සිසුන්ට උපදෙස් දෙන්න.

පියවර 3

සිසුන් ගවේෂණයෙන් ලත් තොරතුරු පන්තියට අනාවරණය කරවන්න.
කණ්ඩායම් අතර සංවාදයකට ඉඩ සලසන්න.
විෂය කරුණු පදනම් කරගෙන සමාලෝචනයක යෙදෙන්න.

පැවරුම     දහම් ගුණ මාතෘකා කොට ක්ෂණික කථාවාරයක් සංවිධානය කරන්න.

**මූලාශ්‍රය** :

නගර සූත්‍රය - (සංයුක්ත නිකාය)
අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය - (මජ්ඣිම නිකාය)
වේළුද්වාර සූත්‍රය - (සංයුක්ත නිකාය)
සූවිසි මහ ගුණය - රේරුකානේ චන්ද විමල හිමි

**නිපුණතා මට්ටම 2.2** : බුද්ධ ධර්මයෙහි සුවිශේෂ ලක්ෂණ හා එහි ප්‍රායෝගික අගය දැක වර්තායනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 32

**ඉගෙනුම් ඵල** : අන්තවාදී බවින් තොර මධ්‍යස්ථ පුද්ගලයෙකු වෙයි.
සැහැල්ලු දිවි පෙවෙතක් ගත කරයි. යහපත හැඳින අයහපත බැහැර කරයි. අධික කාමභෝගී බවින් දුරුවෙයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

2.2.1 බුදු දහම දේව අනාවරණයක් නොවීම.

- ඇතැම් ආගමික ඉගැන්වීම් මෙන් බුදු දහම දේව අනාවරණයක් නොවන බව.
- බුදු දහම බෝසතුන් විසින් කරන ලද ආර්ය පර්යේෂණයේ ප්‍රතිඵල වශයෙන් අනාවරණය කරගන්නා ලද දහමක් බව.
- ගිහි පැවිදි, ස්ත්‍රී පුරුෂ ආදී කිසිදු භේදයකින් තොරව ප්‍රඥාව ඇති ඕනෑම අයෙකුට අවබෝධ කළ හැකි බව.

2.2.2 බුදු දහම ආත්මවාදයක් නොවීම.

- අන්‍ය දාර්ශනිකයන් ඉගැන්වූ ආකාරයේ නොවෙනස් වූ භවයෙන් භවයට ගමන් කරන සදාකාලික වු ආත්මයක් හෝ මගේ ය යි ගතහැකි කිසිවක් පර්මාර්ථ වශයෙන් නැතැයි දැකීම අනාත්ම දර්ශනය බව.
- බෞද්ධ ඉගැන්වීම්වල "අත්ත" ශබ්දය තමා යන තේරුමෙන් සම්මුති වශයෙන් භාවිතා වී ඇතත් එයින් ආත්මයක් අදහස් නොවන බව.
- "සබ්බේ ධම්මා අනත්තා" යන්නෙන් සියලු ආත්මවාද ප්‍රතික්ෂේප වන බව.

2.2.3 සිතා විමසා පසක් කළ යුතු දහමක් වීම

- විමර්ශනාත්මක ව ගවේෂණශීලීව කටයුතු කිරීමෙන් දහම අවබෝධ කොටගත හැකි බව.

2.2.4 බුදු දහමෙහි විශ්ව සාධාරණ බව හා එය මධ්‍යම දේශනාවක් හා මධ්‍යම ප්‍රතිපදාවක් වීම.

- ඉඳුරන් පිනවමින් කාමුක ජීවිතයක් ගත කිරීම ජීවිතයේ හරය කොටගත් ග්‍රාම්‍ය ප්‍රතිපදාව කාමසුකල්ලිකානුයෝගය බව.
- කටුක ලෙස ශරීරය පීඩාවට පත් කිරීම විමුක්ති මාර්ගය කර ගැනීම අත්තකිලමථානු යෝගය බව.
- මේ දෙකම අන්තවාදී අනාර්ය ප්‍රතිපත්ති ලෙස බුදු දහමින් බැහැර කෙරෙන බව.
- බුදු දහමේ ආර්ය මාර්ගය ලෙස දැක්වෙන්නේ මධ්‍යම ප්‍රතිපදාව හෙවත් ආර්ය අෂ්ටාංගික මාර්ගය බව.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :** පියවර 1 සිසුන්ට ධර්ම චක්‍රය , ත්‍රිශූලය, කුරුසය, අඩසඳ සමඟ තරුව දැක්වෙන රූප ඉදිරිපත් කරන්න. පුද්ගලයාගේ ඇතිවීම පිළිබඳව ඉදිරිපත්ව ඇති විවිධ ආගමික මතවාද කෙටියෙන් ඉදිරිපත් කරන්න.

පියවර 2 බුදුදහමේ ඉගැන්වීම්වල ප්‍රායෝගික ලක්ෂණ අධ්‍යයනයට සිසුන් තනි තනිව යොමු කරන්න. බුදු දහම හැර වෙනත් ආගම්වල ආගමික තොරතුරු ද හැකි පමණ රැස් කරන්නට උපදෙස් දෙන්න.

පියවර 3 සිසුන් රැස්කරගත් කරුණු පන්තියට ඉදිරිපත් කරවන්න. සිසුන් විවෘත සංවාදයකට යොමු කරන්න.
අන් ආගම් අතරින් බුදු දහම ඉදිරියෙන් සිටින සුවිශේෂ ලක්ෂණ ඇති බව පෙන්වා දෙමින් අවශ්‍ය කරුණු සමාලෝචනයක යෙදෙන්න.

පැවරුම බුදු දහම "සිතීමේ හා විමසීමේ නිදහස - තහවුරු කරයි." යන්න මාතෘකා කොට කථික තරඟයක් පවත්වන්න.

**මූලාශ්‍රය** :

අනත්ත ලක්ඛණ සූත්‍රය - (සංයුක්ත නිකාය)
ධම්මචක්ක පවත්තන සූත්‍රය - (සංයුක්ත නිකාය)
සච්ච විභංග සූත්‍රය - (මජ්ඣිම නිකාය)
මහා චත්තාරීසක සූත්‍රය - (මජ්ඣිම නිකාය)

**නිපුණතා මට්ටම 2.3** : බුද්ධ ධර්මයෙහි ප්‍රකටවන උභයාර්ථ සාධන ලක්ෂණ ආදර්ශයට ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 15

**ඉගෙනුම් ඵල** : ස්වාර්ථ, පරාර්ථ ම සලකා ක්‍රියා කරන්නකු බවට පත්වෙයි.
මෙලොව පරලොව යහපත සලකා කටයුතු කරයි.
පිරිහීම වළක්වා ගත යුතු බව දක්වා ක්‍රියා කරයි.
යහපත් ලෙස ධනය උපයයි.
සමාජ යුතුකම් ඉටු කරයි.
යහපතෙහි හැසිරෙයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

2.3.1 බුද්ධ ධර්මයෙහි ප්‍රකටවන උභයාර්ථ සාධන ලක්ෂණ

- මෙලොව පරලොව යනුවෙන් ද ස්වාර්ථ පරාර්ථ යනුවෙන්ද උභයාර්ථය හැඳින්විය හැකි බව.
- මෙලොව හා පරලොව දියුණුව උදෙසා මංගල සූත්‍රයේ කරුණු තිස් අටක් දේශනා කර ඇති බව.
- පරාභව සූත්‍රයේ ඉගැන්වීම් තුළින් පුද්ගලයාගේ හා සමාජයේ පරිහානියට හේතුවන කරුණු අවධාරණය කරන බව.
- පුද්ගලයකු විසින් බැහැර කළ යුතු හැසිරීම් වසල සූත්‍රයෙන් ඉදිරිපත් කැරෙන බව.
- ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ එන මෙලොව පරලොව දියුණුවට අදාළ වන කරුණු අනුගමනයෙන් පුද්ගලයකුගේ උභයාර්ථ සාධනයම සිදුවන බව.
- සිඟාලෝවාද සූත්‍රය පිළිපැදීමෙන් ද පුද්ගලයාට හා සමාජයට උභයාර්ථ සාධනයම උදාකරගත හැකි බව.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

පියවර 1: මංගල, පරාභව, ව්‍යග්ග පජ්ජ, සිඟාලෝවාද, වසල යන සූත්‍රවල කොටස බැගින් වූ දේශනා පාඨ - තැටි වාදන යන්ත්‍රයක් මගින් ශිෂ්‍යයන්ට ශ්‍රවණයට අවස්ථාව ලබා දෙන්න.
ඉදිරිපත් කරන ලද සූත්‍ර පාඨ කවර සූත්‍රවලට අදාළ දැයි සිසුන් විමසන්න.
මෙම සූත්‍රවල අන්තර්ගතය මෙලොව පරලොව දියුණුවට උපකාරවත් වන බව පැහැදිලි කරන්න.
සංවාද මණ්ඩපයක් සිසුන් අතරින් තෝරා ගැනීමට මෙහෙයවන්න. ලේඛක කණ්ඩායමක් ද පත් කරන්න.

පියවර 2 අදාළ නිර්දිෂ්ට සූත්‍ර සිසුන්ට ලබා දෙන්න.
සූත්‍ර පාඨවල අන්තර්ගතය ජීවිතයේ යහපැවැත්ම සඳහා යොදාගත හැකි ආකාරය පිළිබඳ සංවාදශීලීව කරුණු ඉදිරිපත් කරන්නට සිසුන් මෙහෙයවන්න.
සාකච්ඡා මධ්‍යයෙන් සංවාදයට ඉදිරිපත්වන කරුණු ලේඛනගත කර ගැනීමට ලේඛක මණ්ඩලයට උපදෙස් දෙන්න.

පියවර 3 සිසුන් ලේඛනගත කරගත් කරුණු නැවත සංවාදශීලී විවෘත මණ්ඩපයක සාකච්ජාවට යොමු කරන්න.
තවදුරටත් පැහැදිලි කිරීම සඳහා කරුණු සමාලෝචනයක යෙදෙන්න.

පැවරුම කණ්ඩායම් වාර්තාව ලේඛනගත කොට මුද්‍රිත පිටපත බැගින් සිසුන් අතර බෙදා හැරීමට සලස්වන්න.

**මූලාශ්‍රය** : මංගල සූත්‍රය (සූත්ත නිකාය)
පරාභව සූත්‍රය (සූත්ත නිකාය)
ව්‍යග්ගපජ්ජ සූත්‍රය( අංගුත්තර නිකාය)
සිඟාලෝවාද සූත්‍රය (දීඝ නිකාය)
වසල සූත්‍රය (සූත්ත නිකාය)

**නිපුණතාව 3.0** : සංඝ සමාජයේ පරමාර්ථ සහ ප්‍රතිපත්ති විමර්ශනය කොට ඉන් ආදර්ශ ලබමින් එහි චිරස්ථිතියට දායකවෙයි.

**නිපුණතා මට්ටම 3.1** : සංඝ සමාජයේ ආරම්භය , බුද්ධ කාලීන විකාශය සහ සඟ ගුණ හඳාරමින් ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 35

**ඉගෙනුම් ඵල** :

සඟරුවනෙහි ගුණ ආදර්ශයට ගෙන අල්පේච්ඡ ජීවිතයක් ගත කරයි.
පැවිදි දිවියෙහි වටිනාකම තේරුම්ගෙන සඟරුවනට සම්මාන දක්වයි.
ශාසනය රැක ගැනීමේ අවශ්‍යතාවය පිළිගනියි.
සංඝරත්නයට සිව්පස සපයා දෙයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

3.1.1 ප්‍රාග් බෞද්ධ පබ්බජ්ජා සංකල්පය

- සමාජයේ ගිහි පැවිදි යන ප්‍රභේදය ප්‍රාග් වෛදික අවදියේ සිටම පැවැති බව හා වේද වේදාන්ත යුග ඔස්සේ එය විවිධ වෙනස්කම්වලට ද ලක්වෙමින් විකාශයට පත් වූ බව.
- බුදුරදුන් ධරමාන අවධිය වනවිට ශ්‍රමණ බ්‍රාහ්මණ යනුවෙන් යම් යම් සම විසමතා සහිත වූ ප්‍රධාන පැවිදි සම්ප්‍රදාය දෙකක් පැවති බව.
- එම සම්ප්‍රදායවලට අයත් පැවිදි කොටස් විමුක්තිය හා එයට අදාළ පිළිවෙත් ද අරබයා විවිධ අදහස් දැරූ බව.
- බෞද්ධ පැවිද්දට එම සම්ප්‍රදායවලින් යම් යම් ආභාෂයන් ලැබී ඇති බව.

3.1.2 බුදු සසුනේ ඉගැන්වෙන පබ්බජ්ජාව සහ එහි ප්‍රභේද

- පස්වග භික්ෂූන්ගෙන් බෞද්ධ පැවිද්ද ආරම්භ වූ බව හා අනුක්‍රමයෙන් එය විකාශයට පත් වූ බව.
- බෞද්ධ පැවිද්දෙහි පිරිපුන් පිරිසිදු බඹසර ඉගැන්වෙන බව
- අල්පේච්ඡතාව බෞද්ධ පැවිද්දෙහි විශේෂ ලක්ෂණයක් වන බව.
- මුල් යුගයේ බෞද්ධ පැවිද්දන් සංචාරක ජීවිත ගත කළ බව.
- ඒහි භික්ඛු පබ්බජ්ජාව පස්වග භික්ෂූන්ගෙන් ඇරඹෙන බව. බුදුරදුන් විසින් පමණක් එම පැවිද්ද සිදු කළ බව.
- සරණාගමන පැවිද්ද පසුව ඇති වූ බව.
- එම පැවිදි ක්‍රමය භික්ෂූන් විසින් ද ප්‍රාදේශීය වශයෙන් සිදු කළ හැකි යැයි බුදුරදුන් අනුදැන වදාළ බව.

3.1.3 සාමණේර සීලය හා උපසම්පදා සීලය

- සාමණේර යන්නෙන් පුහුණුව ලබන ආධුනික පැවිද්ද අදහස් වන බව.

- පැවිදි දස සීලය සාමණේර ශීලය වන බව.

- උපසම්පදා සීලය මගින් පැවිද්දා භික්ෂු සමාජයේ වගකීම් සහිත තත්ත්වයකට පත්වන බව.
- ප්‍රාතිමෝක්ෂ ශික්ෂාවන් උපසම්පදා භික්ෂූන්ට පමණක් අදාළ බව.

3.1.4 සුපටිපන්නෝ පාඨයේ නව වැදැරුම් සහ ගුණ

බෞද්ධ භික්ෂූන් වහන්සේ සුවිශේෂ ගුණ නවයකින් සමන්විත බව.

1 සුපටිපන්න - මනා පිළිවෙත් හි යෙදී සිටින බව.
2 උජුපටිපන්න - ඍජු ප්‍රතිපත්තියක පිහිටා සිටින බව.
3 ඤායපටිපන්න - සත්‍ය පිළිවෙත්හි පිහිටා සිටින බව.
4 සාමීචි පටිපන්න - නිවැරදි පිළිවෙත්හි පිහිටා සිටින බව.
5 ආහුනෙය්‍ය - පූජාවන්ට යෝග්‍ය වන බව.
6 පාහුනෙය්‍ය - දුරසිට ගෙනැවිත් පිදීමට සුදුසු බව.
7 දක්ඛිණෙය්‍ය - දක්ෂිණාවන් පිළිගැනීමට සුදුසු බව.
8 අංජලිකරණීය - ගෞරව ලැබීමට සුදුසු බව.
9 අනුත්තර පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස - ලෝකයාට අනුත්තර වූ පින්කෙතක් බව.

පියවර 1 : "සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාණ සච්ජි කරණත්ථාය ..." යනාදි පාඨය ප්‍රදර්ශනය කර එහි අර්ථය කියාදී පාඩමට ප්‍රවිශ්ට වන්න.
පස්වග තවුසන් මහණවීම පිළිබඳව කරුණු සාකච්ජා කරන්න.
එතැන් පටන් අගසව් තනතුරු ප්‍රදානය තෙක් සාසනික ව්‍යාප්තිය පැහැදිලි කරන්න.

පියවර 2 මූලාශ්‍ර ආශ්‍රය කරමින් පැවිද්ද පිළිබඳ කරුණු එක්රැස් කරන්නට ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න.
බෞද්ධ පැවිද්ද පිළිබඳව විකාශය හා උපසම්පදාව සම්බන්ධ කරුණු සෙවීම සඳහා ගවේෂණයෙහි යොදවන්න.

පියවර 3 රැස්කරගත් කරුණු පන්තියට අනාවරණය කරවන්න.
ඌන පූරණ අදහස් සහන සංවාදයට යොමු කරවන්න.
අවශ්‍ය සංවර්ධනාත්මක අදහස් ලබා දෙන්න.

පැවරුම මූලාශ්‍ර අධ්‍යයනයෙන් සපයා ගත් තොරතුරු අදාළ මූලාශ්‍ර නාමය යටතේ ඇතුළත් කොට ලේඛනයක් සකස් කරන්න.

**මූලාශ්‍රය** :
මහා ඛන්ධකය (මහාවග්ගපාලි)
සංඝානුස්සතිය (විසුද්ධි මාර්ගය)
භික්ෂු සමාජය ( දේවාලේගම මේධානන්ද හිමි)
උපසම්පදා ශීලය (රේරුකානේ චන්දවිමල මාහිමි)

**නිපුණතා මට්ටම 3.2** : සංඝ සමාජයේ පරිපාලනය හා සිව්පස පරිභෝග ක්‍රමය හැඳින සමාජය තුළ සාමූහිකව ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 18

**ඉගෙනුම් ඵල** : සාමූහිකව තීරණ ගනිමින් සහජීවනයෙන් ක්‍රියා කරයි.
සහේතුකව යහ තීරණ ගනිමින් කටයුතු කරයි.
බහුතරයේ කැමැත්ත වැදගත් වන්නේ ධාර්මිකත්වය තහවුරු වන අවස්ථාවලදී පමණක් බව පිළිගෙන කටයුතු කරයි.
පුද්ගලයාට හික්මීම සඳහා විවිධ වූ නීති රීති වලට එකඟවීමට සිදුවන බව තේරුම් ගනියි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

3.2.1 ආරාම ප්‍රතිග්‍රහණය, ශික්ෂාපද පැනවීම හා සාංඝික දේපල ක්‍රමය

- වස්සාන සෘතුවෙහි අධික වර්ෂාව නිසා ඇති වූ දුෂ්කරතා මත බුදුරදුන් භික්ෂූන්ට වස් එළඹීමට උපදෙස් දුන් බව.
- රජගහනුවර සිටුතුමන් ආරාම හැටක් කරවා පිදීම හා ඒවා භික්ෂූන්ට පිළිගැනීමට බුදුරදුන් අනු දැන වදාළ බව.
- මුල් විසි වසර ගත වෙද්දී භික්ෂු සමාජයේ ආසවට්ඨානීය ධර්ම පහළ වූ බව.
- භික්ෂු ජීවිතයේ අරමුණු වලට නොගැලපෙන හැසිරීම් වැළැක්වීම සඳහා විනය නීති පනවන ලද බව.
- භික්ෂුවගේ ආයති සංවරයත්, මහජනයාගේ පැහැදීමත් සද්ධර්මයේ චිර පැවැත්මත් සලකා විනය නීති පැනවූ බව.
- උපසම්පදා භික්ෂූන්ගේ සංවරයට හා සමගියට උපයෝගීවන විනය නීති ප්‍රාතිමෝක්ෂයට ඇතුළත් බව.
- භික්ෂු සමාජයේ සාමූහිකත්වය ඇතිකර ලීම සඳහා සාංඝික ක්‍රමය බුදුරදුන් විසින් පනවා ඇති බව.
- උපසපන් භික්ෂූන් වහන්සේලා සිව් නමක් වැඩ සිටින තැනක "ඉමං භික්ඛං භික්ඛු සංඝස්ස දේම" යනාදි වශයෙන් තුන් වරක් පවසා පවරණ යම් දක්ෂිණාවක් හෝ වෙනත් කැප සරුප් දෙයක් පිළිගැනීම සාංඝික ක්‍රමය බව.

3.2.2 විනය කර්ම හා ගුරු සිසු සබඳතා

- විනය නීති ක්‍රියාත්මක කිරීම සඳහා නියමිත පරිදි නියමිත ස්ථානයක දී අවශ්‍ය ගණ පූරණය සහිතව උපසපන් භික්ෂූන්ගේ සභාවක් පැවැත්විය යුතු බව හා එය විනය කර්මයක් හෙවත් සංඝ කර්මයක් වශයෙන් හැඳින්වෙන බව.
- පැවිදි කිරීම , උපසපන් කිරීම, පොහොය කිරීම, කඨින ඇතිරීම යනාදිය විනය කර්ම බව.
- නිවේදනය හෙවත් එක්වරක් කියවීම (ඤත්ති කර්මය)

දෙවරක් කියවීම (ඤත්ති දුතිය කර්මය)
තුන්වරක් කියවීම (ඤත්ති තතිය කර්මය)
යනුවෙන් විනය කර්මයකදී යෝජනාවක් සම්මත කර ගැනීමේ ක්‍රම තුනක් ඇති බව.

- වරද පිළිගන්නවුන්ට සමාව ලැබීම හා දෙපක්ෂය සමගි වූ විට ගැටලුව ඉවත දැමීම, සිහි මුලා ව වරද කළවුන් නිදහස් කිරීම, ආදී අධිකරණ සමථ ක්‍රම මගින් මානව හිමිකම් සුරැකෙන බව.

- කිසිදු සංඝ කර්මයක් හෝ අධිකරණ සමථයක් ක්‍රියාත්මක කිරීමට කිසිම භික්ෂුවකට තනි බලයක් නැති අතර සංඝ සාමග්‍රීයෙන් ම කළ යුතු බව.
- බහුතරයේ කැමැත්ත වැදගත් වන නමුත් බහුතරය අධර්මවාදීන් යයි පෙනී යන විට වැඩි ඡන්දයෙන් ගත් තීරණය වුවද වලංගු නැති බව.
- උපාධ්‍යාය - සද්ධි විහාරික, ආචාර්ය - අන්තෙවාසික සම්බන්ධතා පිය පුතු සංකල්පය පදනම් කොට ගොඩ නැගී ඇති බව.
- අලුත උපසපන් වූ භික්ෂුව ගුරුවරයෙකු යටතේ පුහුණුව ලැබිය යුතු අතර එය නිස සමාදන් වීම යනුවෙන් හැඳින්වෙන බව.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**:

පියවර 1
භික්ෂූන් වහන්සේලාගේ සංවරශීලී පැවැත්ම ගිහි ජනතාවගේ ප්‍රසාදයට හේතුවන බව. පැහැදිලි කරන්න.

පියවර 2 භික්ෂූන් වහන්සේලාගේ කාර්යභාරය උදෙසා ආරාම, විනය, සහසතු දේපල කුමන අයුරකින් බලපාන්නේදැ යි කරුණු ගවේෂණයට සිසුන් යොමු කරන්න. මූලාශ්‍ර අධ්‍යයනයට උපදෙස් දෙන්න.

පියවර 3 සිසුන් රැස්කළ කරුණු පන්තිය ඉදිරියේ අනාවරණය කරවන්න.
සිසුන් සංවාදයක් සඳහා පොළඹවමින් සමාලෝචනයක යෙදෙන්න.

පැවරුම : භික්ෂු සමාජයේ පැවැත්ම උදෙසා ආරාම ප්‍රතිග්‍රහණය , ශික්ෂාපද පැනවීම හා සාංඝික දේපල ක්‍රමය කෙසේ ඉවහල් වූයේද යන්න පැහැදිලිවනසේ රචනාවක් ලියන්න.

**මූලාශ්‍රය** :

මහා ඛන්ධකය - මහා වග්ගපාලි
විනය කර්මපොත - රේරුකානේ චන්දවිමල හිමි
භික්ෂු සමාජය - දේවාලේගම මේධානන්ද මාහිමි
ඛන්ධක විනය - හේන්පිටගෙදර ඤාණසීහ මාහිමි

**නිපුණතාව 4.0** : භාරතීය බෞද්ධ ධර්ම සංගායනා අධ්‍යයනය කරමින් ශාසන ආරක්ෂාවට හා ශාසන උන්නතියට කැපවෙයි.

**නිපුණතා මට්ටම 4.1** : බුදුරදුන් ධරමාන සමයෙහි ධර්ම විනය ආරක්ෂා කරගැනීම සඳහා යොදන ලද විධි විධාන අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 22

**ඉගෙනුම් ඵල** : පැවරෙන වගකීම් මැනවින් ඉටු කරයි.
තනතුරුවලින් උද්දාමයට පත් නොවී මැදිහත් වෙයි.
තමා සතු දක්ෂතාවය හඳුනාගෙන කටයුතු කරයි.
දත් දේ අන්අයට බෙදා දීමට - ඉගැන්වීමට යොමුවෙයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

4.1.1 ශ්‍රාවක ශ්‍රාවිකා අග තනතුරු පිරිනැමීම, ධර්මධර, විනයධර, සූත්‍රධර ආදී විශේෂ තනතුරු පත් කිරීම

- ධර්ම විනය ආරක්ෂා කර ගැනීම සඳහා මුල් අවධියේ ශ්‍රාවක සංවිධානය ඉවහල් වූ බව
- බුදුරදුන් විශේෂඥයන් හැඳිනගෙන තනතුරු ප්‍රදානය කළ බව.
  - ධර්ම කථිකයන් අතර මන්තානි පුත්ත තෙරණුවන්
  - සැකෙවින් කී දෙය විස්තර කර දෙන්නන් අතර මහා කත්‍යායන තෙරණුවන්
  - බහුශ්‍රැතයන් , ප්‍රඥාවන්තයන් හා ධාරණ ශක්තිය ඇත්තවුන් අතර ආනන්ද තෙරණුවන්
  - විනය ධරයන් අතර උපාලි තෙරණුවන්
  - මහා නුවණැති ශ්‍රාවකයින් අතර සාරිපුත්ත තෙරණුවන්
  - ඍද්ධිමතුන් අතර මහ මුගලන් තෙරණුවන් ආදී වශයෙන් තනතුරු ප්‍රදානය කළ බව.

4.1.2 ශ්‍රාවක ශ්‍රාවිකාවන් ධර්ම ප්‍රචාරයෙහි උනන්දු කරවීම

- මාතෘ භාෂාවෙන් ධර්මය හැදෑරීමට බුදුරදුන් විසින්ම ශ්‍රාවකයන්ට අනුමැතිය දීම ධර්ම විනයෙහි චිර පැවැත්මට හේතු වූ බව
- ධර්ම විනයෙහි චිර පැවැත්ම පිණිස සංගායනා කිරීමේ අවශ්‍යතාව බුදුරදුන් විසින්ම පෙන්වා දී ඇති බව

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** : පියවර 1 විද්‍යාලයේ ශිෂ්‍ය නායක නායිකාවන් තෝරා ගන්නා විට දී අනුගමනය කරනු ලබන ක්‍රියා පිළිවෙල සාකච්ඡාවට ලක් කරන්න.
නායකත්වය ලැබීමේදී සුවිශේෂී වු ගුණාංග ඇගයීමට ලක්වන බව සිසුන්ට පෙන්වා දෙන්න.
බුදු සසුනේ ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ සුවිශේෂී දක්ෂතා අනුව ප්‍රධාන තනතුරු ලබා දී ඇති බව සිසුන්ට පැහැදිලි කරන්න.

පියවර 2 ශිෂ්‍යයන් කණ්ඩායම් දෙකකට බෙදා එක් කණ්ඩායමකට භික්ෂූන් වහන්සේට තනතුරු හිමිකරදීම පිළිබඳව සහ අනෙක් කණ්ඩායමට භික්ෂුණීන් වහන්සේලාගේ තනතුරු හිමිකර දීම පිළිබඳවත් කරුණු ගවේෂණයට අවස්ථාව සලසා දෙන්න.
මූලාශ්‍ර අධ්‍යයනයට හා පුස්තකාල භාවිතයට උපදෙස් දෙන්න.

පියවර 3 කණ්ඩායම් රැස් කල දත්ත පන්ති කාමරයේ අනාවරණය කරවන්න.
සංවර්ධනාත්මක අදහස් ලබාදෙමින් මාතෘකා පිළිබඳ සමාලෝචනයක් කරන්න.

පැවරුම බුද්ධකාලීන ශ්‍රාවක ශ්‍රාවිකාවන් පිළිබඳ තොරතුරු ඉගෙනීමේදී මූලාශ්‍රය කරගත හැකි ග්‍රන්ථ නාමාවලියක් සකස් කරන්න.

| | | |
|---|---|---|
| **මූලාශ්‍රය** : | මහා ඛන්ධකය | - (මහා වග්ග පාලි) |
| | සංගීති සූත්‍රය | - (දීඝ නිකාය) |
| | පාසාදික සූත්‍රය | - (දීඝ නිකාය) |
| | මහා පරිනිබ්බාණ සූත්‍රය | - (දීඝ නිකාය) |
| | එතදග්ගපාලි | - (අංගුත්තර නිකාය) |

**නිපුණතා මට්ටම 4.2** : බෞද්ධ චින්තනයේ පෝෂණයට හා ව්‍යාප්තියට ධර්ම සංගායනාවලින් සැලසුන සේවය අගය කරමින් ශාසන චිරස්ථිතිය සඳහා ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 42

**ඉගෙනුම් ඵල** :

සාමූහිකව ගන්නා තීරණ ක්‍රියාවට නගයි.
නායකත්වයට ගරු කරයි.
සම්පත් රැකගැනීමට හා පවත්වා ගැනීමට ක්‍රියා කරයි.
දත් දේ අන් අයට බෙදා දීමට කටයුතු කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** : 4.2.1 ප්‍රථම, ද්විතීය, තෘතීය සංගායනා

- ප්‍රථම ධර්ම සංගීතිය
- සුභද්ද භික්ෂුවගේ වගකීමෙන් තොර ප්‍රකාශය පළමුවන සංගීතියට ආසන්නතම හේතුව බව
- වෙනත් ඓතිහාසික ශාසනික හා සාමාජික හේතු පැවති බව
- මහා කාශ්‍යප මහ තෙරණුවන් සහ ධර්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරණුවන් ප්‍රමුඛ ශාසන භාරධාරි මහ තෙරවරුන් පන්සිය නමකගේ සහභාගිත්වයෙන් සංගායනාව සිදුවූ බව
- රජගහනුවර සප්තපර්ණී ගුහාද්වාරයේ දී අජාසත්ත රජතුමාගේ අනුග්‍රහය හා ආරක්ෂාව ඇතිව මෙම සංගීතිය පැවැත්වූ බව
- බුද්ධ පරිනිර්වාණයෙන් තුන් මසක් ඇවෑමෙන් පැවැති මෙම සංගීතියේ දී පළමුව විනයත්, දෙවනුව ධර්මයත් සංගායනා වූ බව
- බුදුරදුන්ගේ සම්මුඛ ශ්‍රාවකයන් වශයෙන් සැලකෙන මහා කාශ්‍යප, උපාලි, ආනන්ද, මහා කච්චායන, අනුරුද්ධ, පුණ්ණ මන්තානිපුත්ත, කොට්ඨිත, වංගීස, කුමාර කාශ්‍යප ආදී ශාසන භාරධාරි මහතෙරවරුන් මෙම සංගීතියට සහභාගී වූ බව

4.2.2 බුද්දානු බුද්දක ශික්ෂා විනිශ්චය

- බුද්දානු බුද්දක ශික්ෂාපද ගැටලුව පැන නැගීම හා මහා කාශ්‍යප තෙරණුවන්ගේ අනුශාසනයෙන් කිසිදු ශික්ෂා පදයක් වෙනස් නොකිරීමට තීරණය කළ බව
- ඡන්න තෙරණුවන්ට බ්‍රහ්ම දණ්ඩය පැනවීම, සංඝීතිකාරක ආනන්ද තෙරණුවන්ට දොස් පැවරීම හා උන්වහන්සේ ඒ ගැන කරුණු දැක්වීම හා පුරාණ තෙරණුවන් කළ ප්‍රකාශය ද මෙහි දී වැදගත් වන බව
- බුදුරදුන් විසින් දේශිත ධර්මය හා විනය ඒකරාශි කොට පිටක වශයෙන් බෙදීම හා භාණක වරුන් පත් කිරීම ශාසන චිරස්ථිතියට හේතුවූ බව.

4.2.3 ද්විතීය සංගීතිය

- වජ්ජි භික්ෂූන් විසින් ඉදිරිපත් කරන ලද දස අකැප වස්තු විනය විරෝධී ද නැද්ද යන්න නිශ්චය කිරීම දෙවන ධර්ම සංගීතිය පැවැත්වීමේ ආසන්න හේතුව වූ බව.

- බුදුරදුන් ධරමාන අවධියේ සිටම වර්ධනය වූ වෙනත් හේතු ද පැවති බව.
- සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයකට පසුව කාලාශෝක රජතුමාගේ අනුග්‍රහය ඇතිව විශාලා මහනුවර වාලුකාරාමය දී මෙම සංගීතිය පැවැත්වුණු බව.
- මෙම සංගීතියට සබ්බකාමී, රේවත, යස, යන මහතෙරවරුන් ප්‍රමුඛ සත් සියයක් සහභාගී වූ බව.

- සංගායනාවේ ප්‍රතිඵල වශයෙන් දස වස්තුව - විනය විරෝධී යැයි තීරණය වීම හා එය ශාසන චිරස්ථිතියට හේතු වූ බව.
- මෙම සංගීතියෙන් පසු සංඝ සමාජයේ බෙදීයාමක් සිදුවූ බව.

4.2.4 තෘතීය ධර්ම සංගීතිය

- ධර්මාශෝක අධිරාජයා බුදුසමය වැළඳ ගැනීමෙන් පසුව බුද්ධ ශාසනයට විශේෂ අනුග්‍රහ දැක්වූ බව හා එම අනුග්‍රහ කෙරෙහි ලොල්වූ අන්‍යතීර්ථකාදීන් බුදු සසුනට ඇතුළු වී සසුන කෙලෙසන්නට වූ බව.
- ශාසන සංශෝධනයක් කොට ධර්ම විනය රැකගැනීම් වස් සංගායනාවක් පැවැත්වීමට, මොග්ගලිපුත්ත තිස්ස තෙරණුවන් ගේ උපදෙස් ඇතිව ධර්මාශෝක රජතුමන් විසින් අනුග්‍රහ දක්වන ලද බව.

- මොග්ගලී පුත්ත තිස්ස තෙරණුවන්ගේ මූලිකත්වයෙන් ධර්ම විනයධර මහ තෙරවරුන් දහස් නමකගේ සහභාගිත්වයෙන් පැලලුප් නුවර අශෝකාරාමයේදී මෙම සංගීතිය පැවැත්වූ බව.

- මෙම සංගීතියේදී මෝග්ගලීපුත්ත තිස්ස තෙරණුවන් පරවාද ඛණ්ඩනය කරමින් ද සකවාද උද්දීපනය කරමින් ද කථාවත්ථුප්පකරණය නම් ග්‍රන්ථයක් සම්පාදනය කළ බව හා එය ථෙරවාද අභිධර්ම පිටකයට එක් කළ බව.

4.2.5 නවරට සසුන් පිහිටුවීම

- සංගීතිය අවසානයේ මොග්ගලිපුත්ත තිස්ස තෙරණුවන්ගේ අනුශාසනා පරිදි , ධර්මාශෝක රජුගේ අනුග්‍රහය ඇතිව, ශ්‍රී ලංකාව ඇතුළු රටවල් නවයකට ධර්මදූත කණ්ඩායම් පිටත්කර යවන ලද බව.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**: පියවර 1

පහළ ශ්‍රේණිවලදී ඉගෙනගත් ධර්ම සංගායනා පිළිබඳ සිසුන්ගේ මතකය අලුත් කරමින් කරුණු විමසන්න.

ඒ අදාළව ධර්ම සංගායනාවලින් සැලසුන සේවය අගය කිරීමට ලක් කරන්න.

පියවර 2

ධර්ම සංගායනා සංවිධානය නිසා සිදුවූ ශාසන සංවර්ධනය ගවේෂණයට සිසුන් යොමු කරන්න.
මේ සඳහා සිසුන් කණ්ඩායම් තුනකට බෙදා ප්‍රථම, ද්විතීය, තෘතීය සංගායනා පිළිබඳව කරුණු රැස් කරන්නට උපදෙස් දෙන්න.
මූලාශ්‍ර අධ්‍යයනයට සිසුන් යොමු කරන්න.

පියවර 3

සිසුන් රැස්කළ තොරතුරු අනාවරණය කරවන්න.
ඌණ පූරණය සඳහා කරුණු ඉදිරිපත් කළ පළමු කණ්ඩායමට අවස්ථාව දෙන්න.
අනෙක් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ද ලබා ගන්න.
විෂය කරුණු ද අදාළ කරගෙන සමාලෝචනයක යෙදෙන්න.

පැවරුම

4.2ට අදාළව කෙටි ප්‍රශ්න 50ක් සම්පාදනය කොට දැනුම මිනුම තරඟයක් පවත්වන්න.

**මූලාශ්‍රය** :

පංච සතික බන්ධකය - (චුල්ල වග්ග පාලි)
සත්ත සතික බන්ධකය - (චුල්ලවග්ග පාලි)
මහා වංශ, දීප වංශ කථාවත්ථුප්පකරණය
මිලින්ද පඤ්හ
ලක්දිව මහායාන අදහස් - මොරටුවේ සාසනරතන හිමි
බෞද්ධ ශිෂ්ටාචාරයේ ව්‍යාප්තිය -රෙජී වීරමන්

**නිපුණතාව 5.0** : පාලි ත්‍රිපිටකයේ සැකැස්ම හැඳින ධර්මය හැදෑරීමෙහි ක්‍රමවත් බව ඇති කර ගනියි.

**නිපුණතා මට්ටම 5.1** : පාලි ත්‍රිපිටකයේ සැකැස්ම හදාරා එහි අන්තර්ගතය සැකෙවින් හැඳින ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 36

**ඉගෙනුම් ඵල** : පාලි මූලාශ්‍රය ඇසුරින් බුදු දහම වැඩිදුරටත් හදාරයි.
ත්‍රිපිටකයේ අන්තර්ගතය පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කරයි.
ශාසන පැවැත්මට ත්‍රිපිටකයේ උපයෝගීතාව දැන ක්‍රියා කරයි.
ත්‍රිපිටක ධර්ම ග්‍රන්ථ මතු පරපුර සඳහා ආරක්ෂා කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

5.1.1 විනය, සූත්‍ර, අභිධර්මය සහ අටුවා යන පද නිර්වචනය

- විවිධ වූ විශේෂ වූ පර්යායෙන් ශ්‍රාවකයන්ගේ කය, වචනය, හික්මවනු ලබන බැවින් සංඝයාගේ ශික්ෂණය පිණිස බුදුරදුන් කළ පැනවීම් විනය යන නාමයෙන් හඳුන්වනු ලබන බව.
- සංඝයාගේ අධිශීල ශික්ෂාවට ප්‍රමුඛ වූ මුල් වූ යන අර්ථයෙන් විනය නීති ප්‍රාතිමෝක්ෂ නාමයෙන් හඳුන්වන බව.
- බ්‍රාහ්මණ සම්ප්‍රදාය තුළ අමුණන ලද නූල යන අර්ථයෙන් සූත්‍ර යන පදයත් , මැනවින් කියන ලද යන අර්ථයෙන් සූත්ත යන පදයත් භාවිත කොට ඇති බව සහ මේ පද දෙකම ඔවුන්ගේ ඉගැන්වීම් හෝ සංස්කෘත භාෂාවේ නීති රීති ආදිය හැඳින්වීම සඳහා භාවිත කොට ඇති බව.
- බුදුරදුන් වදාළ ධර්ම විනය අතුරින් ධර්මය පාලි සූත්ත යන පදයෙන් අදහස් කොට ඇති අතර එහි භාවිත සංස්කෘත පදය සූත්‍ර නම් වන බව.
- පාලියෙහි සූත්ත යන්න මැනවින් දේශනා කරන ලද මැනවින් සංග්‍රහ කරන ලද මැනවින් අර්ථ රසය ගලායන, අන්තර්ගතය මැනවින් රක්ෂා කරන ලද යනාදී අර්ථ වලින් භාවිත කොට ඇති බව
- ධම්ම යන පදයට අභි යන උපසර්ගය එක්වීමෙන් අභිධම්ම යන පදය නිර්මාණය වී ඇති බව.
- අභි යන උපසර්ගයෙන් අතිරේක ධර්මය විශිෂ්ට ධර්මය ගැඹුරු ධර්මය ලෙස ධම්ම යන පදයේ අර්ථය උද්දීපනය වන බව.
- අභිධර්මයේ විශිෂ්ට භාවය නම් සත්ත්ව පුද්ගල ආදී සම්මුති වශයෙන් නොව ඛන්ධ, ආයතන, ධාතු ආදී වශයෙන් පරමාර්ථය විවරණය කිරීම වන බව.

5.1.2 විනය පිටකයේ සැකැස්ම

- බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂු , භික්ෂුණී උභතෝ සංඝයාගේ යහපැවැත්ම පිණිස පනවන ලද නීති රීති ඇතුළත් කෘති සමූහය විනය පිටකය යනුවෙන් හැඳින්වෙන බව.
- විනය පිටකය පාරාජිකපාලි, පාචිත්තිය පාලි, මහාවග්ග පාලි,

චුල්ලවග්ග පාලි, පරිවාර පාලි යනුවෙන් කොටස් පහකින් සමන්විත බව.

- භික්ෂු විනය පාරාජික, සංඝාදිසේස, අනියත, නිස්සග්ගිය, පාචිත්තිය, පාටිදේසනීය, සේඛියා හා අධිකරණ සමථ යනුවෙන් ශික්ෂාපද දෙසිය විසිහතකින්ද, භික්ෂුණී විනය, පාරාජිකා, සංඝාදිසේස, නිස්සග්ගිය, පාචිත්තිය, පාටිදේසනීය, සේඛියා, අධිකරණ සමථ යනුවෙන් ශික්ෂාපද තුන්සිය එකොළහකින්ද සමන්විත බව.
- සූත්ත විභංග , ඛන්ධක, පරිවාර යනුවෙන් ද විනය පිටකය වර්ග කළ හැකි බව.

5.1.3 සූත්‍ර පිටකයේ සැකැස්ම

- බුදුරජාණන් වහන්සේ විසින් අවුරුදු හතලිස්පහක් තුළ දේශනා කරන ලද ධර්මය සංග්‍රහ කොට ඇති ග්‍රන්ථ සමූහය සූත්‍ර පිටකය නමින් හැඳින්වෙන බව.
- සූත්‍ර පිටකය දීඝ නිකාය, මජ් ම නිකාය, සංයුක්ත නිකාය, අංගුත්තර නිකාය සහ ඛුද්දක නිකාය යනුවෙන් කොටස් පහකට බෙදා දක්වා ඇති බව.
- බ්‍රහ්මජාල සූත්‍රයේ පටන් දීර්ඝ ප්‍රමාණ සූත්‍ර තිස්හතරක් දීඝ නිකායට ඇතුළත් බව.
- මූල පරියාය ආදී මධ්‍යම ප්‍රමාණ සූත්‍ර 152 ක් මජ්ඣිම නිකායට ඇතුළත් බව.
- සංයුත්ත වශයෙන් බෙදන ලදුව කෙටි හා මධ්‍යම ප්‍රමාණ සූත්‍ර 7762 ක් සංයුත්ත නිකායට ඇතුලත් බව.
- එක් එක් අංකයෙන් වැඩි වන එක බැගින් එන කරුණු දෙක බැගින් වන කරුණු ආදී ලෙසින් සංග්‍රහ කර ඇති සූත්‍ර 9557ක් අංගුත්තර නිකායට ඇතුලත් බව.
- සූත්‍ර පිටකය තුළ පටිච්චසමුප්පාදය, චතුරාර්ය සත්‍යය, ආර්ය අෂ්ටාංගික මාර්ගය, ත්‍රිලක්ෂණය, කර්මය , පුනර්භවය ආදී මූලික බෞද්ධ ඉගැන්වීම් මෙන් ම අතිරේක ධර්ම කරුණු ද අන්තර්ගත බව.
- බුද්ධ භාෂිත මෙන් ම ශ්‍රාවක භාෂිත ද සූත්‍ර පිටකයේ ඇතුළත් බව.

5.1.4 අභිධර්ම පිටකයේ සැකැස්ම

- බුදුදහමෙහි අන්තර්ගත විශේෂ වූත් ගැඹුරු වූත් ධර්මය ඇතුළත් සප්තප්‍රකරණ අභිධර්ම පිටකය යනුවෙන් හැඳින්වෙන බව.
- එම සප්ත ප්‍රකරණ ධම්මසංගණී, විභංග, ධාතුකථා, පුද්ගල පඤ්ඤත්ති, යමක, පට්ඨාන, කථාවත්ථු යනුවෙන් නම් කෙරෙන බව.
- අභිධර්ම විභාග හෙවත් පඤ්චස්කන්ධාදී විශ්ලේෂණයත්, සංසට්ඨ අවිනිබ්භෝග ආදී පදවලින් කියැවෙන සංශ්ලේෂණයන් යන ක්‍රමවේදයන් මත රදා පවතින බව.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

පියවර 1 පුස්තකාලයට සිසුන් කැඳවා ගෙන ත්‍රිපිටක පොත් පිළිබඳව සරල හැඳින්වීමක් කරන්න.
පොත් කිහිපයක් සිසුන් වෙතට පත්කර පොත්වල අන්තර්ගතය ගැන සරල විමසීමක් කරන්න.
ආදි බුදුදහම චිරාත් කාලයක් ආරක්ෂා වූයේ පාලි ත්‍රිපිටක ධර්මය නිසා බව සිසුන් දැනුවත් කරන්න.

පියවර 2 ශිෂ්‍යයන් කණ්ඩායම් 3කට බෙදන්න.
විනය, සූත්‍ර, අභිධර්ම පිටක පිළිබඳ කරුණු ගවේෂණයට කණ්ඩායම් තුනට පවරන්න.
ලබාගන්නා තොරතුරු ලේඛනගත කරන්න.
පුස්තකාලය හා අන්තර්ජාලය භාවිතා කළ හැකි බව සිසුන්ට ප්‍රකාශ කරන්න.

පියවර 3 සිසුන් රැස්කළ තොරතුරු පන්තිය ඉදිරියේ අනාවරණය කරවන්න.
ඌන පූරණ අදහස් කණ්ඩායම් වෙතින්ම ලබාගන්න.
විෂය අන්තර්ගතය ආශ්‍රය කොට සමාලෝචනයක යෙදෙන්න.

පැවරුම පුස්තකාලය භාවිතා කොට බුද්ධ ජයන්ති මුද්‍රණයට අයත් ත්‍රිපිටක ධර්ම ග්‍රන්ථවල නාමලේඛනයක් සකස් කරන්න.

**මූලාශ්‍රය :**

බන්ධක විනය - හේන්පිටගෙදර ඤාණසීහ හිමි
ප්‍රාතිමෝක්ෂ විවරණය - බුප්ජම්පොල ධම්මපරායනතිස්ස හිමි
පාලි සාහිත්‍යය - අග්ග මහා පණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත මාහිමි
නිවන් මග - අභිධර්ම විමර්ශන අංකය
පාලි සාහිත්‍යයේ ඉතිහාසය - පරිවර්තනය - හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි
මහාවග්ගපාලි - බුද්ධජයන්ති මුද්‍රණය
සූත්‍ර පිටකය - බුද්ධ ජයන්ති මුද්‍රණය
ත්‍රිපිටක සූචිය - පොල්වත්තේ බුද්ධ දත්ත මාහිමි
ත්‍රිපිටක පරීක්ෂණය - හිත්තැටියේ උදිත මාහිමි
සූත්‍ර ධර්ම නාමාවලිය - නිවන්දම ශ්‍රී ධර්ම කීර්ති හිමි

## පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම

ඉගෙනුම - ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත් ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැනගැනීම පිණිස ඇගයීම යොදා ගතයුතු බවත් සෑම ගුරුවරයකු විසින් ම දත යුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යොන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත් එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදුවන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදුවිය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දීය. මෙය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑම අවස්ථාවක දී සිදුවිය හැකි බව තේරුම් ගැනීම ගුරුවරයකුට අවශ්‍ය ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්වීම සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදාගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් හෝ නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනීමත්, ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩි දියුණු කිරීම සඳහා යොදාගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීපව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදාගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියකට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්ය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල් පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහිදී ශිෂ්‍යයා නිරතුරුව ඇගයීමට ලක්විය යුතු අතර, ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදුවන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරුණු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුන්ට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීමය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ය. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back ) හා ඉදිරි පෝෂණය ( Feed Forward ) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කරගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මගහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම් - ඉගැන්නුම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි හඳුනා ගැනීම සිසුන්ට අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශවවලට සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමුවිය යුතු ය. මේ සඳහා යොදාගත තහැකි හොඳම ක්‍රමය වන්නේ සන්තතිකව සිසුන් ඇගයීමට පාත්‍ර කිරීමට ඉඩ ප්‍රස්ථා සලසන පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමයයි.

යථෝක්ත අරමුණු සහිතව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්නුම් ක්‍රියාවලියත් සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් වඩාත් කාර්යක්ෂම කිරීම පිණිස වඩා හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම්, ඉගැන්නුම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට සහ ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ. එම ප්‍රභේද මෙසේය :

1. පැවරුම්
2. ව්‍යාපෘති
3. සමීක්ෂණ
4. ගවේෂණ
5. නිරීක්ෂණ
6. ප්‍රදර්ශන/ඉදිරිපත් කිරීම

7. ක්ෂේත්‍ර චාරිකා
8. කෙටි ලිඛිත පරීක්ෂණ
9. ව්‍යුහගත රචනා
10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ
11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
12. ශ්‍රවණ පරීක්ෂණ
13. ප්‍රායෝගික ක්‍රියාකාරකම්
14. කථනය
15. ස්ව නිර්මාණ
16. කණ්ඩායම් ක්‍රියාකාරකම්
17. සංකල්ප සිතියම
18. ද්විත්ව සටහන් ජර්නල
19. බිත්ති පුවත්පත්
20. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්
21. ප්‍රශ්න හා පිළිතුරු පොත්
22. විවාද
23. සාකච්ඡා මණ්ඩල
24. සම්මන්ත්‍රණ
25. ක්ෂණික කථා
26. භූමිකා රංගන

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්, ඉගැන්නුම් සහ ඇගයීම් ක්‍රම සෑම එකක් ම සෑම විෂයයක් සම්බන්ධයෙන් සෑම විෂයය ඒකකයකට ම යොදා ගත යුතු යැයි අපේක්ෂා නොකෙරෙයි. තම විෂයයට , විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වග බලා ගත යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල ගුරුවරුන්ට තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදාගත හැකි ඉගෙනුම් - ඉගැන්නුම් හා ඇගයීම් ප්‍රභේද පිළිබඳ සඳහනක් තිබේ. ඒවා ගුරුවරුන් විසින් සුදුසු පරිදි තම පන්තියේ සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස යොදාගත යුතු වෙයි. ඒවා භාවිත නොකොට මග හැරීම සිසුන්ට තම ශාස්ත්‍රීය හැකියා මෙන් ම ආවේදනික ගති ලක්ෂණත් මනෝචාලක දක්ෂතාත් පිළිබඳ වර්ධනයක් ළඟා කර ගැනීමත් ප්‍රදර්ශනය කිරීමත් පිළිබඳ අඩුපාඩු ඇති කරවයි.

**වාරය** : 1

**උපකරණ අංක** : 1

**නිපුණතාව** : 1.0

**නිපුණතා මට්ටම** : 1.1

**උපකරණයේ ස්වභාවය** : බුද්ධි මණ්ඩල සාකච්ජාවක්

**ක්‍රියාවලිය** : බුදුරජාණන් වහන්සේගේ සුවිශේෂත්වය පිළිබඳව මූලාශ්‍ර අධ්‍යයනයෙන් කරුණු සොයන්නට සිසුන්ට පවරා, රැස්කරගත් කරුණු ආශ්‍රය කොටගෙන සමකාලීන මහණ බමුණන් අතර බුදුරජාණන් වහන්සේගේ විශේෂත්වය යන මැයෙන් බුද්ධි මණ්ඩල සාකච්ජාවක්

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1. ඉගෙනුම් ක්‍රියාවලියට අදාළ බව | 4 | 3 | 2 | 1 |
| 2. සාකච්ජා මණ්ඩල සංවිධානය කරගැනීම මෙහෙයවීම හා තේමා වෙන්කර ගැනීම. | 4 | 3 | 2 | 1 |
| 3. සංවර්ධනාත්මකව සාකච්ජාව පවත්වා ගැනීම | 4 | 3 | 2 | 1 |
| 4. ඉදිරිපත් කරන අදහස්වල නිර්මාණශීලීත්ව හා තර්කානුකූල බව | 4 | 3 | 2 | 1 |
| 5. සම්පිණ්ඩනය, නිගමන හා නිගමනවලට හේතු ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| අවසාන ලකුණු ලැබූ මුළු ලකුණු / 2 | | | | 20 / 10 |

**වාරය** : 1

**උපකරණ අංක** : 1

**නිපුණතාව** : 1.0

**නිපුණතා මට්ටම** : 1.2

**උපකරණයේ ස්වභාවය** : ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහනක්

**ක්‍රියාවලිය** : 1.2 නිපුණතා මට්ටමට අදාළව එන 1.2.1, 1.2.2 හා 1.2.3 හි අන්තර්ගත කරුණු ආශ්‍රය කරගෙන සිසුන්ට කෙටි ප්‍රශ්න 20 බැගින් සකස් කරන්නට උපදෙස් දෙන්න. ඒවා එකතු කරගෙන සුදුසුම හා ක්‍රමවත් අයුරින් සැකසූ ප්‍රශ්න 50ක් තෝරාගෙන සිසුන් කණ්ඩායම් 6කට බෙදා ප්‍රශ්න විචාරාත්මක තරගයක් පවත්වන්න. තරග කොන්දේසි අදාළ වන අයුරින් ඉදිරිපත් කරන්න.

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1. විෂයට අදාළ වන පරිදි ප්‍රශ්න සකස් කර ගැනීම | 4 | 3 | 2 | 1 |
| 2. උචිත පරිදි කණ්ඩායම් සංවිධානය කර ගැනීම | 4 | 3 | 2 | 1 |
| 3. ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ කුසලතාව | 4 | 3 | 2 | 1 |
| 4. පිළිතුරු ඉදිරිපත් කිරීමට දක්වන දායකත්වය | 4 | 3 | 2 | 1 |
| 5. ලකුණු වාර්තා කිරීම හා සමස්ත දායකත්වය | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| අවසාන ලකුණු = ලැබූ මුළු ලකුණු / 2 | | | | --------<br>10 |

**වාරය** : 1

**උපකරණ අංක** : 1

**නිපුණතාව** : 1.0

**නිපුණතා මට්ටම** : 1.3

**උපකරණයේ ස්වභාවය** : සාකච්ඡා මණ්ඩල

**ක්‍රියාවලිය** : සිසුන් කණ්ඩායම් හතරකට බෙදා පහත සඳහන් පරිදි මාතෘකා ලබා දෙන්න.
බුදුරජාණන් වහන්සේගේ ගවේෂණශීලිත්වය හා විමර්ශනශීලිත්වය
සමානාත්මතාව, සහජීවනය හා අන්‍යයන්ට සවන්දීම.
යථාවාදී තථාකාරී - යථාකාරී තථාවාදී ගුණය
තාදිගුණය හා පද්මාකාර ජීවිතය

මූලාශ්‍ර අධ්‍යයනයෙන් කරුණු ගවේෂණයට මෙහෙයවන්න.
රැස්කළ කරුණු කණ්ඩායම් නායකයන් මගින් පන්තියට ඉදිරිපත් කරවන්න.
එම තොරතුරු කණ්ඩායම් අතර සංවාදයක් ඇති වන අයුරු මෙහෙයවන්න.

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1. තෝරාගත් තොරතුරුවල තේමාවට ඇති අදාළ බව | 4 | 3 | 2 | 1 |
| 2. තේමාව ප්‍රමාණවත් පරිදි තොරතුරු මගින් ඉදිරිපත් වීම | 4 | 3 | 2 | 1 |
| 3. ඉදිරිපත් කරන ලද කරුණුවල අදාළ බව | 4 | 3 | 2 | 1 |
| 4. තර්කානුකූල බව හා අර්ථාන්විත බව | 4 | 3 | 2 | 1 |
| 5. තොරතුරුවලින් සමන්විතය ආවරණය වී ඇති ප්‍රමාණය | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| අවසාන ලකුණු = ලැබූ මුළු ලකුණු / 2 | | | | 10 |

**වාරය** : 1

**උපකරණ අංක** : 1

**නිපුණතාව** : 2.0

**නිපුණතා මට්ටම** : 2.2

**උපකරණයේ ස්වභාවය** : ක්ෂණික කථා

**ක්‍රියාවලිය** භාවිතයෙන් : නිපුණතා මට්ටමට අදාළව විෂය කරුණු අධ්‍යයනයෙන් හා මූලාශ්‍ර කරුණු රැස් කරන්නට සිසුන්ට උපදෙස් දෙන්න.

කරුණු රැස් කිරීමෙන් පසු මාතෘකා අදාළ පරිදි සකසා නියමිත කොන්දේසි මාලාවක් යටතේ ක්ෂණික කථාවාරයක් සංවිධානය කරන්න.

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1. විෂයට අදාළ මාතෘකා සකස් කිරීම | 4 | 3 | 2 | 1 |
| 2. මාතෘකාවට අදාළව කරුණු ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| 3. අදහස් නිර්මාණශීලීව හා තර්කානුකූලව ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| 4. උචිත ලෙස අංගචලනය හා කාල කළමනාකරණය | 4 | 3 | 2 | 1 |
| 5. සම්පිණ්ඩනය , නිගමන හා නිගමනවලට හේතු ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| අවසාන ලකුණු ලැබූ මුළු ලකුණු / 2 | | | | -------- 10 |

**වාරය** : 2

**උපකරණ අංක** : 2

**නිපුණතාව** : 2.0

**නිපුණතා මට්ටම** : 2.2

**උපකරණයේ ස්වභාවය** : බිත්ති පුවත් පතක් සැකසීම

**ක්‍රියාවලිය** : මංගල, පරාභව, ව්‍යග්ගපජ්ජ , සිගාලෝවාද, වසල සූත්‍රයන්ගෙන් මෙලොව පරලොව සංවර්ධනයට ලැබෙන මහපෙන්වීම අධ්‍යයනයට ලක් කරමින් ලිපි ඉදිරිපත් කරන්නට සිසුන්ට පවසන්න.
එම ලිපි උභයාර්ථය සඳහා සූත්‍ර ධර්ම වලින් යන තේමාව යටතේ සකසන ලද පුවරුවක් යොදාගෙන එහි ප්‍රදර්ශනය කරන්න

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඇති සම්බන්ධතාව / එහි උචිත බව | 4 | 3 | 2 | 1 |
| 2. සංවිධානාත්මක බව හා ප්‍රමාණාත්මක බව | 4 | 3 | 2 | 1 |
| 3. අලංකරණය සඳහා යොදා ඇති උපක්‍රම හා ඒවායේ යෝග්‍ය බව | 4 | 3 | 2 | 1 |
| 4. අන්තර්ගතයේ ඇති නිර්මාණශීලි බව හා තර්කානුකූල බව | 4 | 3 | 2 | 1 |
| 5. බිත්ති පුවත් පතක් වශයෙන් නිමැවුමෙහි සාර්ථක බව | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| අවසාන ලකුණු ලැබූ මුළු ලකුණු / 2 | | | | -------- 10 |

**වාරය** : 2

**උපකරණ අංක** : 3

**නිපුණතාව** : 3.0

**නිපුණතා මට්ටම** : 3.1

**උපකරණයේ ස්වභාවය** : ප්‍රශ්න හා පිළිතුරු පොත්

**ක්‍රියාවලිය** : නිපුණතාවට අදාළව ප්‍රාග් බෞද්ධ පබ්බජ්ජා සංකල්පය
බුදු සසුනේ දැක්වෙන පබ්බජ්ජාව හා පැවිද්ද සාමණේර සීලය හා
උපසම්පදා සීලය
නව වැදැරුම් සඟගුණ
ආශ්‍රය කරගෙන කෙටි ප්‍රශ්න 50ක් හා ඒවාට පිළිතුරු ඇතුළත් පොතක්
නිර්මාණය කිරීම.

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1. විෂයට අදාළ වන පරිදි ප්‍රශ්න සකස් කිරීම | 4 | 3 | 2 | 1 |
| 2. ප්‍රශ්න වලට අදාළ පිළිතුරු සකස් කිරීම. | 4 | 3 | 2 | 1 |
| 3. ලේඛන කුසලතාව | 4 | 3 | 2 | 1 |
| 4. ක්‍රමානුකූල බව හා නිමාව | 4 | 3 | 2 | 1 |
| 5. අන්තර්ගතයේ නිර්මාණශීලී බව | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| අවසාන ලකුණු ලැබූ මුළු ලකුණු / 2 | | | | -------- 10 |

**වාරය** : 3

**උපකරණ අංක** : 1

**නිපුණතාව** : 3.0

**නිපුණතා මට්ටම** : 3.2

**උපකරණයේ ස්වභාවය** : විවාද

**ක්‍රියාවලිය** : නිපුණතා මට්ටම 3.2ට අදාළ කරුණු අධ්‍යයනයෙන් හා මූලාශ්‍ර පරිශීලනයෙන් කරුණු රැස්කර ගෙන "සංඝ සමාජයේ පරිපාලනය හා සිව්පස පරිභෝග ක්‍රමය ගිහි සමාජයේ භාවිතයට යොදාගත හැකිය" යන මාතෘකා කොට විවාදයක් පවත්වන්න.

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1. ප්‍රවේශය, මාතෘකාව, පැහැදිලිව හැඳින්වීම හා එහි උචිත බව | 4 | 3 | 2 | 1 |
| 2. මාතෘකාවට අදාළව කරුණු ඉදිරිපත් කිරීම හා සංවිධානාත්මක බව | 4 | 3 | 2 | 1 |
| 3. අදහස් නිර්මාණශීලීව හා තර්කානුකූලව ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| 4. උචිත ලෙස අංග චලනය හා කාලකළමනාකරණය | 4 | 3 | 2 | 1 |
| 5. සම්පිණ්ඩනය, නිගමන හා නිගමන වලට හේතු ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| අවසාන ලකුණු ලැබූ මුළු ලකුණු<br>------------------<br>2 | | | | --------<br>10 |

**වාරය** : 3

**උපකරණ අංක** : 02

**නිපුණතාව** : 4.0

**නිපුණතා මට්ටම** : 4.2

**උපකරණයේ ස්වභාවය** : කෙටි ලිඛිත පරීක්ෂණ

**ක්‍රියාවලිය** : ත්‍රිවිධ සංගායනා ආශ්‍රය කොට සකස් කරන කෙටි පිළිතුරු අපේක්ෂිත පත්‍රයකට නිශ්චිත කාලයක් තුළ පිළිතුරු උගන්වන්න.

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට ඇති සම්බන්ධතාව | 4 | 3 | 2 | 1 |
| 2. සංවිධානාත්මක බව හා ප්‍රමාණාත්මක බව | 4 | 3 | 2 | 1 |
| 3. පිළිතුර නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| 4. කාල කළමනාකරණය | 4 | 3 | 2 | 1 |
| 5. ඉදිරිපත්කළ තොරතුරුවල ගුණාත්මක බව | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| අවසාන ලකුණු = ලැබූ මුළු ලකුණු / 2 | | | | 10 |

**වාරය** : 3

**උපකරණ අංක** : 03

**නිපුණතාව** : 5.0

**නිපුණතා මට්ටම** : 5.1

**උපකරණයේ ස්වභාවය** : ගවේෂණ

**ක්‍රියාවලිය** : පුස්තකාලය භාවිතා කොට බුද්ධ ජයන්ති මුද්‍රණයට අයත් ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ සූත්‍ර පිටකයට අයත් නිකාය ග්‍රන්ථවලින් දීඝ නිකායට හා මජ්ඣිම නිකායට ඇතුලත් සූත්‍ර නාම ලේඛනයක් සකස් කිරීම.

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට ඇති සම්බන්ධතාව | 4 | 3 | 2 | 1 |
| 2. කරුණු රැස්කිරීම | 4 | 3 | 2 | 1 |
| 3. ඉදිරිපත් කරන ලද කරුණුවල නිරවද්‍යභාවය | 4 | 3 | 2 | 1 |
| 4. සංවිධානාත්මක බව හා ප්‍රමාණාත්මක බව | 4 | 3 | 2 | 1 |
| 5. ඉදිරිපත් කිරීමේ ක්‍රමවත්භාවය | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| අවසාන ලකුණු ලැබූ මුළු ලකුණු / 2 | | | | -------- 10 |